මහ රහතුන් වැඩි මඟ ඔස්සේ



ලස්සන වෙන්න කැමති
පින්වත් දරුවන්ට
මෙත් සිත

ඉදිරිපත් කිරීම හර්මියොන් වික්‍රමරත්න

මේ සටහන් තැබූ භික්ෂූන්වහන්සේගේ පුණ්‍යානුමෝදනාව

මාගේ ගුරුදේවයාණන් වහන්සේ වන

අති ගෞරවණීය දොඩම්පහල චන්ද්‍රසිරි

මහනායක ස්වාමීන්වහන්සේට ද

කල්‍යාණමිත්‍රභාවයෙන් උපකාර කළා වූ

සියළුම ගෞරවණීය ස්වාමීන්වහන්සේලාට ද

නිදුක් නිරෝගී සුවපත්භාවය පිණිසත් මේ ජීවිතයේ දීම

චතුරාර්‍ය සත්‍ය ධර්මයන් අවබෝධය පිණිසත්

මෙම ධර්මදානමය කුසලය හේතු වේවා...

ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හැරෙන සදහම් තිළිණයකි...

මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

ලස්සන වෙන්න කැමති පින්වත් දරුවන්ට මෙත් සිත

අති පූජ්‍ය රාජගිරියේ අරියඥාන ස්වාමීන් වහන්සේ
සමඟ කරන ලද ධර්ම සාකච්ඡාවක් ඇසුරින්
සකස් කරන ලද මෙම දහම් ග්‍රන්ථය
පින්වත් දූ පුතුන් සැම වෙත
මෙත් සිතින් පිලිගන්වමු.

ඉදිරිපත් කිරීම

හර්මියොන් වික්‍රමරත්න

© හර්මියොන් වික්‍රමරත්න

ප්‍රථම මුද්‍රණය: 2016 මැයි
පස්වන මුද්‍රණය: 2016 ජූනි

ISBN - 978-955-7887-14-2

නිෂ්පාදන වියදමට මෙම දහම් පොත් ලබා ගැනීම සඳහා විමසන්න.

දුරකථන: 0712199900
0112755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 1.30 දක්වා)

මුද්‍රණය සහ බෙදාහැරීම

ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්
444/3B, පිටිපන දකුණ,
හෝමාගම

මේ ඝෝර කටුක භයානක සංසාරයේ

නියදන , මේ අන්ධකාරයේදී

සසර දුකින් එතෙර වීමට

අධිෂ්ඨානය කරගත් වීර්ය වඩන්

ඔබට මග පෙන්වන "බුදු"

හිමි බුද්ධ ගුණයට වන්දනාත්

ඒ අතිශය ශ්‍රාවකයා

ශ්‍රාවකයකු වේවා , ප්‍රත්‍යේක බුදු වේවා

අර්හත්වයට වේවා

තම තමාම එළඹෙන සුමාර්ගය

තම තමාගේ වීර්ය වලින් ලඟා කර ගනිත්වා.

අද මේ ශාසනය එළඹ අතරතුර

ඔබ නොකල් මරණය

ඔබ නොගැලවේ,

සැනසුම අනුගත වේවා

එළඹ නැතිනම් නිවන් වෙත

නිවන් ලොව දකිත්වා.

මෙන් සහ කාල ප්‍රාර්ථනාව

ඔබ සුමුව සහභාගී වේවා,

තම තමාටම විශ්ව කොට ගනිත්වා.

(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂූන් වහන්සේ විසින් ලියූවකි.)

ස්වාමීන් වහන්ස, කෙනෙක් පැවිදි වෙන්නත්, තව කෙනෙක් පැවිදි නොවී සිටීමටත් හේතුව කුමක්ද?

මට මතකයි, මම පැවිදිවීමට පෙරාතුව, එක්තරා දවසක් නිවසේ කණ්ණාඩි මේසය ඉදිරියට ගිහිල්ලා, මම ලස්සනද කියලා කණ්ණාඩියෙන් මා දෙස බැලුවා. ඒ වෙලාවේ මට සිතුණේ, මම මේ ලෝකේ සිටින අවලස්සන ම මනුෂ්‍යයන්ගෙන් කෙනෙක් කියලයි. එදා මට මගේ කිසි ම ලස්සනක් කණ්ණාඩිය තුළින් පෙනුණේ නැහැ. මම එදා කණ්ණාඩියෙන් මා දෙස බලනකොට, මම ලස්සන කෙනෙක් හැටියට මට පෙනුණා නම්, මම කවදාවත් පැවිදිවෙන්නේ නැහැ. මම අවලස්සනයි කියලා දැක්ක නිසාමයි, මම පැවිදි වුණේ. නමුත් මම අද හොඳාකාරවම දන්නවා, මට තේරෙනවා, මට වැටහෙනවා, මම මේ ලෝකේ ජීවත්වන ලස්සන ම මනුෂ්‍යයන්ගෙන් එක්කෙනෙක්ය කියලා. ගිහි ජීවිතයේ දී අවලස්සන වූ මම, වර්තමානයේ ලස්සන කෙනෙක් බවට පත් කළේ, මේ උතුම් පැවිදි ජීවිතයයි. උතුම් පැවිදිභාවයට පුළුවන්, ඕනෑම අධර්මයෙන් අවලස්සන මනුෂ්‍යයෙක් ම, ධර්මයෙන් ලස්සන පුද්ගලයෙක් බවට පත් කරන්න. යම් පින්වතෙක් පැවිදිවෙන්නේ ඇයි කියලා, පාසල් දරුවෙක් නැඟූ ප්‍රශ්නයට භික්ෂුවට දෙන්න තිබෙන සරල ම පිළිතුරයි, ඉහතින් සඳහන් කළේ. ඔබේ ප්‍රශ්නයේ දෙවැනි කොටස වෙන්නේ, ඇයි කෙනෙක් පැවිදි නොවී ඉන්නේ කියලා. කෙනෙක් පැවිදි නොවන්නේ, තමන් ලස්සනයි කියලා දකින තම ජීවිතය තුළ සැඟවිලා තිබෙන, අධර්මයේ අවලස්සන දකින්න ඇති අදක්ෂභාවය නිසාමයි. පින්වත් ඔබේ ලස්සන රූපයට මුවාවෙලා, තමන් තුළ සැඟවී තිබෙන අධර්මයේ අවලස්සන යම් මනුෂ්‍යයෙක් නොදකින්නේ, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීමේ දුර්වලතාවයන් නිසාමයි. පින්වත් දරුවන් කණ්ණාඩි මේසය ඉදිරියට ගිහිල්ලා, රූපයේ ලස්සන බලනවා වගේම, සතිය සිහිය නැමති ඇසෙන් ඔබ තුළ සකස්වෙන සිතුවිලිවල ලස්සන, අවලස්සන ගැනත් කණ්ණාඩියෙන් බලන්න පින්වත් ඔබ

දක්ෂවෙන්න ඕනේ. පින්වත් දරුවෝ රූපයෙන් කොච්චර ලස්සන වුවත්, දෙමාපියන්ට පුංචි පුංචි අකීකරුකම් කරනවා නම්, පාසලට යන්න, උදේ ම නැගිටින්න කම්මැලි වෙනවා නම්, නංගි මල්ලිලා සමග සණ්ඩු කරනවා නම්, පන්තියේ ගෙදර වැඩ නොකරනවා නම්, අම්මා එපා කියද්දිත් රූපවාහිනිය බලනවා නම්, දරුවන්ගේ මස් ඇසට පෙනෙන, ලස්සන රූපයට මුවාවෙලා ගොඩක් අවලස්සන සැඟවිලා තිබෙනවා.

මේ ධර්මයේ අවලස්සන මතුකොට පෙන්වන කැඩපත තමයි, සතිය සහ සිහිය කියන්නේ. සතිය සිහිය ඇතිවෙන්න නම් පින්වත් දරුවන් සද්ධර්මයේ අර්ථයන්ට අදාළව නුවණින් මෙනෙහි කිරීමට දක්ෂ වෙන්න ඕනේ.

ස්වාමීන් වහන්ස, දරුවන්ගේ සතිය සිහිය දියුණු කොට ගැනීමට අවශ්‍ය නුවණින් මෙනෙහි කිරීමේ ශක්තිය වැඩිදියුණු කොටගන්නේ කෙසේද?

පාසල් දරුවන් තමන්ගේ නුවණින් මෙනෙහි කිරීමේ ශක්තිය වැඩිදියුණු කොට ගැනීමට නම්, නිරතුරුවම තමන්ගේ දෙමාපියන්, ගුරුවරුන්, වැඩිහිටියන් සමඟ කථා කරන්න ඕනේ. පින්වත් දරුවන්ට මතුවෙන ප්‍රශ්න, ගැටලු, සැක සහිත තැන් ගෞරවයෙන් යුතුව අසා දැනගන්න ඕනේ. මෙතනදී තමයි ඔවුන් ලබන අලුත්, නැවුම් දැනුම ඔස්සේ, නුවණින් මෙනෙහි කිරීමෙන් පින්වත් දරුවන්ගේ සතිය සිහිය වැඩිදියුණු වෙන්නේ.

පින්වත් දරුවන් ගුරුතුමාගෙන් විමසනවා, ඇස් දෙක අන්ධ දරුවන් ජීවත් වෙන ලෝකය තුළ, කොහොමද අපිට ලස්සන ඇස් දෙකක් ලැබුණේ කියලා. එවිට ගුරුතුමා කියනවා, ඔබට ලස්සන ඇස් දෙකක් ලැබිලා තිබෙන්නේ, ඔබ පෙර ජීවිතයේදී අනුන්ගේ දියුණුව දැකලා ඊර්ෂ්‍යා කරලා නැහැ. ඔබ ගිය ජීවිතයේදී බුදුරජාණන් වහන්සේට පහන් ආලෝකයන් පූජා කරලා තිබෙනවා. ඔබ අනුන්ට

අකුරු කියලා දීලා, අනුන්ගේ දෑස් පාදලා තිබෙනවා. ගුරුතුමාගේ හේතුඵල ධර්මයන්ට අදාළ පිළිතුර අහලා, දැන් දරුවන් නුවණින් මෙනෙහි කරනවා. එවිට දරුවන් තුළ සතිය සිහිය මෝදු වෙනවා. ඔබ ඊට පස්සේ, අනුන්ගේ දියුණුව දැකලා, ඊර්ෂ්‍යාව ඇතිකොට ගන්නේ නැහැ. පන්තියේ ඔයාට වැඩිය දක්ෂ දරුවෙක් දැකලා කේන්ති ගන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේට පහන් ආලෝකයන් පූජා කිරීමට මැලි වෙන්නේ නැහැ. ඔබේම පන්තියේ දරුවෙකුට නොදන්නා අධ්‍යාපන කරුණක් කියලා දීමට, අතපසු වූ සටහනක් ලබාදීමට ඔබ මැලිවෙන්නේ නැහැ. ඔබ දැන් දන්නවා මම අනුන්ට ඊර්ෂ්‍යා කළොත් මීළඟ ජීවිතයේදී මගෙත් ඇස්දෙක දුර්වල වේවි කියලා.

පින්වත් දරුවන් ගුරුතුමාගෙන් අහනවා, ඇයි දරුවෙක් ලස්සන වෙලා උපදින්නේ කියලා. එවිට ගුරුතුමා පිළිතුරු දෙනවා. "දරුවෙක් ලස්සන වෙලා උපදින්නේ, පෙර ජීවිතයේ මෛත්‍රිය පුහුණු කරලා, බුදු සමිඳුට ලස්සන සුවඳ මල්, දැත් දෝවනය කරලා මල්වලට පැන් ඉසලා, පූජා කරලා මහා සංඝ රත්නයට දන්පැන් පූජා කරලා තිබෙන නිසායි කෙනෙක් ලස්සන වෙලා උපදින්නේ" කියලා. මේ කාරණා ගුරුතුමාගෙන් දැනගත්තාට පසුව, දරුවන් හේතුඵල ධර්මයන්ට අදාළව නුවණින් මෙනෙහි කරනවා. එවිට දරුවන් තුළ සතිය සිහිය මෝදුවෙනවා. මම පන්ති කාමරයේදී, නිවසේදී කේන්ති ගන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේට මල් පූජා කරනකොට දැත් හොඳින් සෝදාගෙනයි මල් පූජා කරන්නේ, මල් වට්ටියට පැන් ඉසලයි පූජා කරන්නේ, පරවුණු මල්, පෙති කැඩුණු මල්, බිම වැටී තිබුණ මල් බුදුන් වහන්සේට පූජා කරන්නේ නැහැ, කාටවත් ම සිත් වේදනාවක් දෙන්නේ නැහැ, හැමෝම කීකරුභාවයෙන් සතුටු කරනවා, දෙමාපියන්, මහා සංඝරත්නයට දන්පැන් පූජා කරන කොට, එම පින්කම්වලට සෘජුව ම සම්බන්ධ වෙනවා. මොකද පින්වත් දරුවන් දැන් දන්නවා කෙනෙක් ලස්සන වෙන්නේ ඉහත හේතුන් නිසාය කියලා.

දරුවෙක් ගුරුතුමාගෙන් අහනවා, ඇයි සමාජයේ මාමා කෙනෙක්, නැන්දා කෙනෙක් වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවරයෙක් වෙන්නේ, ඇයි තවත් මාමා කෙනෙක් කම්කරු රැකියාවක් කරන්නේ කියලා. එතකොට ගුරුතුමා දරුවාට කියනවා, යම් මාමා කෙනෙක්, නැන්දා කෙනෙක් උසස් වෘත්තියක් ලබන්නේ, පෙර ජීවිතයේදී මහණ බමුණන් මුණගැසෙන්න ගිහිල්ලා, ස්වාමීන් වහන්සේලා මුණගැසෙන්න ගිහිල්ලා, අසා දැනගෙන තිබෙනවා, ධර්මය කුමක්ද? අධර්මය කුමක්ද? කියලා, කුසලය කුමක්ද? අකුසලය කුමක්ද? කියලා, සුගතිය කුමක්ද? දුගතිය කුමක්ද? කියලා. මේවා අසා දැනගෙන, දැනගත්තා වූ යහපත් දෙයට අදාළව ජීවත්වෙලා තිබෙනවා. එහි ඵලය තමයි, මේ ජීවිතයේදී පින්වත් දරුවන් උසස් අධ්‍යාපනය තුළින් ලබන වෘත්තිය දැනුම වෙන්නේ. ඒ වගේම යම් දරුවෙක් මේ ජීවිතයේදී උසස් වෘත්තියක් නොලබන්නේ එම දරුවා පෙර ජීවිතයේදී ස්වාමීන් වහන්සේලාගෙන්, දෙමාපියන්ගෙන්, ගුරුවරුන්ගෙන් යහපත අයහපත අසා දැනගෙන, ඊට අදාළව ජීවත්වෙලා නැහැ. ඒ අතීත සාංසාරික පුරුදු, පින්වත් දරුවන්ට මේ ජීවිතයේදී ඇතිවෙන්න පුළුවන්. මේ කාරණාවන් පින්වත් ගුරුතුමාගෙන් අසා දැනගත්තාට පසුව දරුවන් පුහුණු වෙනවා, ස්වාමීන් වහන්සේලාගෙන්, මහණ බමුණන්ගෙන්, දෙමාපියන්ගෙන්, ගුරුවරුන්ගෙන් හොඳ නරක අසා දැනගෙන, කුසලය, අකුසලය අසා දැනගෙන දැනගත් කාරණාවන් නුවණින් මෙනෙහි කොට අයහපතින් බැහැර වී, අකුසලයෙන් බැහැර වී, යහපත ජීවිතය තුළින් ශක්තිමත් කොට ගන්න. එවිට පින්වත් දරුවන් තුළ ඊට අදාළව සතිය සිහිය මෝදු වෙනවා. එවිට එම දරුවා, අනාගතයේ නූගත්භාවයට හේතුවෙන කාරණාවලින් බැහැරවෙලා, උගත්භාවයට අදාළව ළමා ජීවිතය ශක්තිමත් කොටගන්නවා.

පින්වත් දරුවෙක් ගුරුතුමාගෙන් විමසනවා, ඇයි මාමා කෙනෙක් දුප්පත්වෙලා උපදින්නේ කියලා, ඇයි නැන්දා කෙනෙක් අල්පේශාක්‍ය

හැටියට පත්වෙලා උපදින්නේ කියලා. එවිට පින්වත් ගුරුතුමා දරුවාට පැහැදිලි කොට දෙනවා, යම් කෙනෙක් දුප්පත් හැටියට, අල්පේශාඛ්‍යභාවයට පත්වෙලා උපදින්නේ පෙර ජීවිතයේදී එම පින්වතුන් තමන්ගේ වත්පෝසත්කම් නිසා, ලස්සන රූපය නිසා, උගත්කම් නිසා මාන්නයට පත්වෙලා, අහංකාරභාවයට පත්වෙලා, උඩඟුභාවයට පත්වෙලා, අනුන්ට කායිකව, මානසිකව හිංසා කිරීම නිසයි, අනුන්ව පහත් කොට සැලකූ නිසයි, පෙර ජීවිතයේදී මහා සංඝරත්නයට දන්පැන් පූජා නොකළ නිසයි, අල්පේශාක්‍යභාවය දුප්පත්භාවයට, කුලහීනභාවයට පත්වෙලා උපදින්නේ කියලා. පින්වත් ගුරුතුමාගේ හේතුඵල ධර්මයට අදාළ පිළිතුරු දැනගන්න දරුවා, එම කරුණු නුවණින් මෙනෙහි කොට, සතිය සිහිය මෝදුකොට ගන්නවා. තමා අනාගතයේ අල්පේශාක්‍යභාවයට, කුලහීනභාවයට හේතුවෙන මාන්නය, අහංකාරකම, උඩඟුකම ජීවිතයෙන් බැහැර කරනවා. හැමෝම නිහතමානී, සුවච, කීකරු, මහා සංඝ රත්නයට දන්පැන් පූජා කරන, යහපත් දරුවන් වෙනවා.

තමන් පන්තියේ පළමුවැනියාය කියලා, දුර්වල ශිෂ්‍යයන්ගේ, සිත රිදවන්නේ නැහැ. තමන් පොහොසත් කියලා, දුප්පත් ශිෂ්‍යයාගේ සිත රිදවන්නේ නැහැ. තමන් ලස්සනයි කියලා, ලස්සන අඩු ශිෂ්‍යයාට විහිළු කරන්නේ නැහැ. එම දරුවා නුවණින් මෙනෙහි කොට දකිනවා, අනුන්ව පහත් කොට සැළකුවොත්, එම ක්‍රියාව තමන්ගේ අනාගත ජීවිතය අල්පේශාක්‍යභාවයට, කුලහීනභාවයට පත්වීමට හේතු වෙනවාය කියලා.

පින්වත් දරුවෙක් ගුරුතුමාගෙන් විමසනවා, ඇයි කෙනෙක් නිරෝගි ජීවිතයක් ලබන්නේ කියලා. එවිට පින්වත් ගුරුතුමා කියනවා, යමෙක් නිරෝගි ජීවිතයක් ලබන්නේ, එම පින්වත් දරුවා පෙර ජීවිතයේදී සතුන්ව මරලා නැහැ. සතුන්ට හිංසාවන් කරලා නැහැ, මනුෂ්‍යයන්ට හිංසාවන් සිදු කරලා නැහැ, ක්ෂේන්තිය, ද්වේශය පුහුණු කරලා නැහැ, මහා සංඝ රත්නයට, සිල්වතුන්ට දන්පැන්

පූජා කරලා තිබෙන නිසයි, කෙනෙක් නිරෝගිභාවයට පත්වෙලා ජීවත් වෙන්නේ කියලා. එවිට දරුවා එම කාරණාවන් නුවණින් මෙනෙහි කරලා සතිය සිහිය මෝදු කොටගන්නවා. මම අනාගතයේ රෝගිභාවයට හේතුවෙන සත්ව ඝාතනය, සත්ව හිංසනය, මනුෂ්‍ය හිංසනය සිදු කරන්නේ නැහැය කියලා, අම්මාගේ, තාත්තාගේ, ගුරුවරයන්ගේ සිත රිදවන්නේ නැහැ කියලා. එවිට එම දරුවා කුහුඹුවෙකුට, කැරපොත්තෙකුටවත් හිංසාවක් කරන්නේ නැහැ. බිත්තියේ දුවන හූනන්ගේ වලිගය කඩන්නේ නැහැ. බල්ලන්ට, පූසන්ට ගහන්න යන්නේ නැහැ. මදුරුවෙක් ශරීරයේ වැසුවත්, එම මදුරුවා එළවලා දමනවා. හැබැයි පින්වත් දරුවන් මෛත්‍රිය වඩනවාය කියලා, වර්තමානයේ මදුරුවන්ට දෂ්ඨ කරන්න ඉඩදීලා බලාගෙන නම් ඉන්න එපා. එම ක්‍රියාව මෝහයටයි අයිති වෙන්නේ, මදුරුවාට හිංසා නොකර එළවා දමන්න. මදුරුවන් බෝ නොවන පරිසරයක් සකස්කොට ගන්න දක්ෂ වෙන්න.

පින්වත් දරුවන් ගුරුතුමාගෙන් නොදන්නා කරුණු අසා දැනගෙන, දැනගන්නා වූ කරුණුවලට අදාළව නුවණින් මෙනෙහි කිරීම තුළිනුයි සතිය සිහිය මෝදුකොට ගත යුත්තේ.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවෙක් තුළ අලසභාවය, මාන්නය, අහංකාර බව වැනි ළමා ජීවිතයට නොගැළපෙන ධර්මයන් ඇතිවෙනවා නම් කුමක්ද කළ යුත්තේ?

වැඩිහිටි පින්වතුන්ලා ඊට අදාළ ආදීනවයන් දරුවන්ට පැහැදිලි කොට දෙන්න ඕනේ. දරුවන්ගේ ජීවිතවලට බලපාන මෙවැනි නරක පුරුදු පෙර ජීවිතයේදී පුහුණු කළ පුරුදු වෙන්න පුළුවන්. අලසබව, මාන්නය, අහංකාරකම ළමා ජීවිතවලින් පිසදැමීමට අතට ගත යුතු හොඳ ම උපකරණය තමයි, කොස්ස සහ ඉදල.

පාසල් දරුවෙකුට පුළුවන්, උදෑසන තම පන්තිකාමරය අතුගා, පිරිසිදු කිරීම තුළින්, අලසබව, මාන්නය අවම කොට ගැනීමට වගේම

දිව්‍ය ලෝකයට යන්න අවශ්‍ය කුසල් සංස්කාරයන් මෝදුකොට ගන්න. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඇමදීම හේතුවෙන් තමාගේත්, අනුන්ගේත් සිත් පහදිනවාය කියලා, තමන්ට රූප ශෝභාව ලැබෙනවායි කියලා.

පින්වත් දරුවෙක් සැමදා ම උදෑසන තම කැමැත්තෙන් ම පන්ති කාමරය අමදිනවා නම්, පිරිසිදු කරනවා නම්, පන්ති කාමරයේ පිරිසිදුභාවය දැකලා, පාසල් වත්තේ පිරිසිදුභාවය දැකලා, ඔබේ ගුරු මණ්ඩලය සතුටු වෙනවා. පාසලට පැමිණෙන බාහිර පින්වතුන් සතුටු වෙනවා. පන්ති කාමරයේ ඉගෙන ගන්නා දරුවන්, මානසික පීඩාවකින් තොරව, සතුටු සිතින් ඉගෙනීමේ කටයුතු කරනවා. ඒ විතරක් නොවේ, දරුවන්ට කැමති, පිරිසිදුභාවයට කැමති, දරුවන්ගේ අධ්‍යාපනයට කැමති, දෙවිවරු, දිව්‍යාංගනාවන් සිටිනවා. එම දෙවියන් දිව්‍ය ශ්‍රෝතවලින් දිව්‍ය චක්ඛුවලින් පන්ති කාමරයේ, පාසල් වත්තේ පිරිසිදුභාවය අහලා දැකලා, පන්තිය, පාසල් වත්ත පිරිසිදු කරන දරුවන්ට **'සුවපත් වේවා'** කියලා මෙත් සිත වඩනවා. මේ දරුවන් හොඳින් ඉගෙනගෙන, අනාගතයේ යහපත් පුරවැසියන් වෙලා, දෙවියන් අතරට ම පැමිණේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේමයි පාසලට ආදරය කළ, ශිෂ්‍ය දරුවන්ට ආදරය කළ, අතීතයේ ගුරු මණ්ඩලයේ කටයුතු කොට මිය පරලොව ගිය, ගුරු මහත්ම මහත්මීන්, මිය පරලොව ගොස්, දිව්‍ය ජීවිත ලබලා, ඔබේ පාසල උපාදානය කොටගෙන ජීවත්වෙනවා. පින්වත් දරුවන් පාසල, පන්ති කාමරය පිරිසිදුව තබා ගන්නකොට, එම අතීත ගුරු වෘත්තිය කළ, වර්තමානයේ දිව්‍ය පිරිස් එම දරුවන්ට ආශිර්වාද කරනවා, එම දරුවන්ව ආරක්ෂා කරනවා.

පින්වත් දරුවන් ස්වකැමැත්තෙන් පන්ති කාමරය පිරිසිදු කරන කොට, එම දරුවා තුළ අනුන් සතුටු කිරීමට ඇතිවන කැමැත්ත නිසා, මෛත්‍රී සහගත සිතුවිලි නිසා එම දරුවාගේ ශරීරයේ ලේ ධාතුව නිරතුරුවම මෛත්‍රියෙන් පිරිසිදු වෙනවා. එවිට එම දරුවාගේ ජීවිතයට ආයුෂ, වර්ණය, සැපය, බලය එකතු වෙනවා, නිරෝගීභාවය ලැබෙනවා, ප්‍රසන්න, නිහතමානී දරුවෙක් වෙනවා, පින්වත් ගුරුවරුන්ගේ ආශිර්වාදය ලබන දරුවෙක් වෙනවා.

පින්වත් දරුවෙක් කොස්සත් ඉදලත් අරගෙන පන්ති කාමරය, පාසල් වත්ත පිරිසිදු කරන කොට, පුංචි දරුවන්ගේ ජීවිතවලට කොච්චර ගුණාත්මක දේවල් ලැබෙනවද? කොස්සත්, ඉදලත් අරගෙන අවංකවම පන්ති කාමරය පිරිසිදු කරන දරුවා සිතන්න ඕනේ, මම මේ පිරිසිදු කරන්නේ පන්ති කාමරය නොවේ, පාසල් වත්ත නොවේ, මගේ කම්මැලිකම, මාන්නය, අහංකාරකම, කේන්තිය කියන කුණුකසළවලින්, දූවිලිවලින් පිරිච්ච මගේ අපිරිසිදු සිතය කියලා. පන්තිය පිරිසිදු කරලා, පාසල් වත්ත පිරිසිදු කරලා, ගෙදර කාමරය පිරිසිදුව තබාගෙන, පුංචි සිත්වල ඇති අපවිත්‍ර කුණුකසළ දූවිලි ඉවත් කොට ගන්න පින්වත් දරුවන් දක්ෂ වෙන්න ඕනේ.

කොස්සක් අරගෙන පන්ති කාමරය පිරිසිදු කරගන්න අකමැති, කම්මැලි දරුවෙක් කියන්නේ, ගොඩක් අපිරිසිදු කුණුකසළ සිත තුළ රැඳුණු දරුවෙක් වෙනවා. එවැනි දරුවන්ගේ සිතුවිලි තුළ ඇති කම්මැලිකම, මාන්නය, අහංකාරකම, අපිරිසිදු බව වැනි කුණුකසළ නිසා, එම පින්වත් දරුවන් රෝගීභාවයට පත්වෙන්න පුළුවන්. අනුන් ඔබට ආදරය නොකරන නිසාම, ඔබ සමාජයට ද්වේශ කරන දරුවෙක් බවට පත්වෙන්න පුළුවන්.

සශ්‍රීක දිව්‍යතලවල ලස්සන දිව්‍ය උයන් වතු තිබෙනවා. මේ දිව්‍ය උයන් හරිම ලස්සනයි. පින්වත් දරුවන් රූපවාහිනියේ එහෙම දැකලා තිබෙනවානේ, මනුෂ්‍ය ලෝකයේ ලස්සන මල් උයන් තිබෙනවා. මනුෂ්‍ය ලෝකයේ තිබෙන සෑම මල් උයන්වලටම වඩා, දිව්‍යතලවල තිබෙන, දිව්‍ය මල් උයන් හරිම ලස්සනයි. දිව්‍ය උයන් කවුරුවත් පිරිසිදු කරන්නේ, නඩත්තු කරන්නේ නැහැ. දෙවියන්ගේ පින නිසාම, එම දිව්‍ය උයන් ස්වාභාවිකවම නඩත්තු වෙනවා. මේ දිව්‍ය උයන්වල ලස්සන දිව්‍ය දිව්‍යාංගනාවන් සතුටු වෙනවා, සෙල්ලම් කරනවා, විනෝද වෙනවා, දිව්‍ය මල් උයන්වල අසිරිය, සුගන්ධය විඳිනවා. මේ පින්වත් දිව්‍ය දිව්‍යාංගනාවන් කියන්නේ, වෙන කවුරුවත් නොවේ, පෙර ජීවිතයේදී ඔබ වගේ ම දරුවන්. එදා එම දරුවන් උදේ පාන්දරින් ම කොස්සය, ඉදල අරගෙන පන්ති කාමරය, පාසල් වත්ත, පන්සල් වත්ත, බෝධි මළුව, ගෙදර පරිසරය පිරිසිදු කරලා, තමනුත්

සතුටුවෙලා අනුන්වත් සතුටු කරපු, පින්වත් දරුවන්. ළමා කාලයේදී ම පුහුණු කරපු පිරිසිදු භාවයට අදාළ චර්යාවන් නිසා, එම යහපත් පුරුදු ජීවිතයේ ශක්තිමත් කොට ගෙන, මරණින් පසු දිව්‍යතලවල ලස්සන මල් උයන් ඇසුරු කොටගෙනම උපත ලබනවා.

බලන්න, පාසල් දරුවෙක්ගේ සතියත් සිහියත්, කොස්සත් ඉදලත් එකතුවුණාම, කොච්චර දෙයක් කරන්න පුළුවන්ද කියලා. නමුත් යම් දරුවෙක් පන්ති කාමරය පිරිසිදුව තබා ගැනීමට උපකාර කරන්නේ නැත්නම්, වෙනත් දරුවෙක් පිරිසිදු කළ පන්ති කාමරය අපවිත්‍ර කරනවා නම්, අම්මා පිරිසිදු කරපු කාමරය, නිවස අපිරිසිදු කරනවා නම්, එම දරුවන් ගුරුවරුන්ගේ, දෙමාපියන්ගේ සිත් අසතුටට පත්කරනවා. තමාගේ සිතත් අපවිත්‍ර කුණුකසළවලින් පුරවා ගන්නවා. මේ නරක පුරුදු තව ශක්තිමත් වී අනාගතයේ ජීවිතයට ගොඩක් අකුසල් සිදුකොට ගන්නවා. එවැනි දරුවන්ට මොකද වෙන්නේ කියලා පින්වත් දරුවන් දන්නවද? පින්වත් දරුවන් දැකලා තිබෙනවානේ මීහරක්, ඌරන් වැනි සතුන් උවමනාවෙන්ම මඩේ ලගිනවා, උවමනාවෙන්ම ශරීරයේ මඩ තවරා ගන්නවා.

ප්‍රේත ලෝකයේ සමහර ප්‍රේත ප්‍රේතියන් සිටිනවා. එම ප්‍රේතයින් කුණුකසළ ගොඩක් ළඟට ගිහිල්ලා, එම කුණුකසළ දෝතින් ම අරගෙන, හිසේ පටන් ශරීරය පුරා දමාගන්නවා. පින්වත් දරුවන් දැකලා තිබෙනවා, මඟතොටේ අපිරිසිදු යාචක පින්වතුන් සිටිනවා. ඒ යාචක පිරිස සිය කැමැත්තෙන් ම කිළිටි ඇඳුම් පැළඳගෙන, ශරීරය පිරිසිදු කරගන්නේ නැතුව තමයි ජීවත් වෙන්නේ. ඉහත එලයන් ගැන සිතනකොට, අනුන් පිරිසිදු කරන ස්ථානයක් යමෙක් අපවිත්‍ර කරනවා නම්, තමන් අපිරිසිදුව ජීවත් වෙනවා නම්, එය පුංචි දරුවන්ට හරිම අනතුරුදායක ක්‍රියාවක් වෙනවා. පින්වත් දරුවන් තමන්ගේ නිවස, කාමරය අපවිත්‍ර කරනවාට වඩා, පොදු පන්ති කාමරය අපවිත්‍ර කිරීම පව් සිද්ධ වෙනවා වැඩියි. දරුවන් තම නිවසේ කාමරය පිරිසිදු කරගන්නවාට වඩා පොදු පන්ති කාමරය පිරිසිදු කිරීම, පින් වැඩි ක්‍රියාවක් වෙනවාය කියන කාරණය පින්වත් දරුවන් තේරුම් ගත යුතු වෙනවා.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවන් ලස්සනට හුඟක් කැමතියි. පාසල් දරුවන්ගේ ජීවිතවලට සැබෑ ම අර්ථවත් ලස්සන එකතු වෙන්නේ කුමන ධර්මතාවයකින් ද?

පාසල් දරුවන්ව ලස්සන කරන ප්‍රධාන ම ධර්මතාවය තමයි මෛත්‍රිය පුහුණු වීම. මෛත්‍රී භාවනාව පුහුණුවීමට පෙරාතුව, පින්වත් දරුවන් මෛත්‍රිය වැඩීමෙන් ඔබට ලැබෙන ආනිශංසයන් ගැන කැමැත්තක් ඇති කොට ගන්න ඕනේ. මෛත්‍රී භාවනාව පුහුණුවීමෙන් දරුවන්ට ලැබෙන ප්‍රධාන ම ආනිශංසය තමයි මනුෂ්‍යයන්ට, දෙවියන්ට, අමනුෂ්‍යයින්ට එම දරුවන්ව ප්‍රිය වෙනවා. පාසල් දරුවන් මෙත් සිත පතුරුවනකොට එම දරුවාට දෙමාපියන්, ගුරුවරුන්, යහළුයෙහෙළියන්, සහෝදරසහෝදරියන් ප්‍රිය වෙනවා. එම දරුවා කීකරු දරුවෙක් වෙනවා, නිහතමානී දරුවෙක් වෙනවා.

පාසල් දරුවන් මෙත් සිත පැතිරවීම තුළින් තමන්ට ලැබෙන තවත් වටිනා ම ආනිශංසයක් තමයි, දරුවන්ට ප්‍රසන්න, ලස්සන, ප්‍රියමනාප රූපයක් ලැබෙනවා. පාසල් වයසේ දරුවන් හුඟක් කැමතියිනේ, ලස්සනට විසිතුරුව අඳින්න පළඳින්න. අනෙක් දරුවන්ට වඩා ලස්සනට හැඩවැඩ වෙන්න කැමති පාසල් දරුවන් ජීවිතයට එකතුකොට ගත යුතු, අර්ථවත් ම විසිතුරු ම ඇඳුම තමයි, මෛත්‍රිය කියන්නේ. මෛත්‍රියේ ආනිශංස හේතුවෙන් පාසල් දරුවන්ට ලස්සන, ප්‍රියමනාප, අනුන්ගේ සිත දිනාගන්න, ආකර්ෂණීය රූපයක්, ප්‍රසන්න මුහුණක් දරුවන්ට ලැබෙනවා. සමහර පාසල් දරුවන් කේන්තිගත්තහම, මුහුණ හරියට කැතවෙනවා. කේන්තිගත්තහම දරුවන්ගේ මුහුණ කැතවෙන්නේ, කේන්තිගන්න කොට, ශරීරයේ ලේ ධාතුව අපිරිසිදු වෙනවා. කේන්තිය නිසා සකස් වෙන මානසික, කායික කැළඹවීම, රතු පැහැති ලේ ධාතුව, කළු පැහැ ගන්වනවා. පින්වත් දරුවන් නිතර නිතර කේන්ති ගන්න කොට ලේ ධාතුව තුළ ඇතිවෙන කැළඹවීම් හේතුවෙන් පිළිකා වැනි භයානක රෝග තත්වයන් ඇතිවෙන්න පුළුවන්, ඔබේ ලස්සන රූපය කැතවෙන්න පුළුවන්. කේන්තිය නිසා සකස්වෙන අකුසල් මූලයන් හේතුවෙන්, ඔබේ කුසල් ශක්තිය හීනවෙලා, ඔබේ ජනප්‍රියභාවය, අධ්‍යාපනය දුර්වල වෙන්න පුළුවන්.

රාහුල කුමාරයා පැවිදිවෙන්නේ අවුරුදු අටේ වගේ වයසෙදී. සාරිපුත්ත මහරහතන් වහන්සේගේ ශිෂ්‍යභාවයෙන් රාහුල කුමරුන් පැවිදි කරවලා, නිග්‍රෝධාරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩසිටිය කුටිය අසල ම කුටියකයි, පුංචි රාහුල ස්වාමීන් වහන්සේ වැඩහිටියේ. බුදුරජාණන් වහන්සේ උදෑසන සිවුර දෙවුර පොරවාගෙන, පාත්‍රයක් අතැතිව, පිණ්ඩපාතයේ වඩින්න කුටියෙන් එළියට වඩින කොටම, පුංචි රාහුල ස්වාමීන් වහන්සේත් සිවුර දෙවුර පොරවාගෙන, පාත්‍රය උරහිසේ එල්ලාගෙන බුදුරජාණන් වහන්සේ පසුපසින් පිණ්ඩපාතයේ වඩිනවා. පුංචි රාහුල ස්වාමීන් වහන්සේට පැවිදිභාවය පිළිබඳව දැනුමක්, තේරුමක්, අර්ථයක් ඒ වන විට ජීවිතයට එකතුවෙලා තිබුණේ නැහැ. පුංචි රාහුල ස්වාමීන් වහන්සේට තිබුණේ බුදුරජාණන් වහන්සේ, තමන්ගේ පියාණන්ය කියලා ඇතිකොටගත් ආස්වාදයක් පමණයි. බුදුරජාණන් වහන්සේ පසුපසින් පිණ්ඩපාතයේ වඩින රාහුල පුංචි හිමියන්ගේ සිතේ කොයි ආකාරයේ සිතුවිලි ද සකස් වෙන්නේ කියලා, බුදුරජාණන් වහන්සේ දිවැසින් බලනවා. පුංචි රාහුල ස්වාමීන් වහන්සේ, මේ වගේ සිතුවිලි සිතමින් තමයි බුදුරජාණන් වහන්සේගේ පසුපසින් වඩින්නේ. මගේ පියතුමා හරිම ලස්සනයි, හරිම ප්‍රසන්නයි, හැමෝම මගේ පියාණන්ට ගරුකරනවා, මගේ පියාණන් වගේ ම මමත් ලස්සනයි, මගේ පියාණන් ළඟින්මයි හැමදා ම මම පිණ්ඩපාතයේ වඩින්නේ, වෙන කාටවත් පියතුමා ළඟින් වඩින්න දෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දිවැසින් දකිනවා, රාහුල හිමියන් බුදුරජාණන් වහන්සේගේ රූපයත්, තමන්ගේ රූපයත් ගැන ලොකු ආස්වාදයකින්, මාන්නයට පත්වෙලයි සිටින්නේ කියලා.

භික්ෂුව රාහුල පුංචි ස්වාමීන් වහන්සේගේ රූප තණ්හාව ගැන සටහන් තැබුවේ, පාසල් වියේ දරුවන් තමන් ලස්සන වෙන්න, අනුන් ඉදිරියේ කැපී පෙනෙන්න කැමතියි කියන කාරණය මතුකොට දක්වන්න. ඒ ළමා මනෝභාවය පුංචි රාහුල හිමියන්ටත් අතීතයේ උරුම ව තිබුණා. ලස්සන වෙන්න කැමති දරුවන්ට ජීවිතය තවත් ලස්සන කොට ගන්න, බුදුරජාණන් වහන්සේ දරුවන්ට කියලා දෙන ධර්මය තමයි මෛත්‍රිය කියන්නේ. මෛත්‍රිය පුහුණු කිරීමෙන් ළමා ජීවිතවලට ලැබෙන අර්ථය, කිළිටි වෙන ඇඳුම්පැළඳුම්වලින්, දහදිය දමන

ශරීරයෙන් ලබන තාවකාලික ආස්වාදය වාගේ දෙයක් නොවේ. මෙත් සිත පුහුණු කිරීමෙන් පින්වත් දරුවන්ගේ ජීවිතය ලස්සන වෙනවා වගේම, දරුවන්ගේ ජීවිත පසුපස පටිච්චසමුප්පන්නව සැඟවී තිබෙන, විපාක නොදුන් අතීත කුසල් සංස්කාර මතුකොටගෙන, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ශක්තිමත්කොට ගැනීමටත් හැකිවෙනවා.

ස්වාමීන් වහන්ස, නපුරු මනුෂ්‍යයන්ගෙන් පාසල් දරුවන්ට සිදුවෙන විනාශකාරී ක්‍රියාවන්ගෙන් මිදීමටත්, මෛත්‍රී භාවනාව ප්‍රගුණ කිරීමෙන් දරුවන්ට හැකියාව තිබෙනවා ද?

වර්තමාන සමාජයේ, පින්වත් මනුෂ්‍යයින් හුඟදෙනෙක් ශීලයෙන් දුර්වලව, කුසල් මූලයන් දුර්වලකොට ගනිමින් යන ගමනක් තමයි ගමන් කරන්නේ. මනුෂ්‍යයාගේ අකුසල් මූලයන්ගේ වැඩිභාවය නිසාම, පාසල් යන අහිංසක නොදරුවාත්, මනුෂ්‍ය ධර්මයන්ට නොගැලපෙන, අශීලාචාර අර්ථයන්ගෙන් තමයි සමහරු දකින්නේ. වර්තමාන සමාජය තුළ, දරුවන් ජීවත්වෙන්නේ රාස්සයින් අරක්ගත්ත දිය පොකුණක ජීවත්වෙන අහිංසක පුංචි දිය කිඳුරන්, දිය කිඳුරියන් වගේ, ඕනෑම මොහොතක අභියෝගයන්ට, අනතුරුවලට විවෘතවයි. එම නිසා වියරු මනුෂ්‍යයින්ගෙන් වන ළමා හිංසනයන්ගෙන් මිදීමට මෛත්‍රී භාවනාව දරුවාට හුඟක් උපකාරී වෙනවා.

පින්වත් ඔබලාගේ තෘෂ්ණාව වැඩිවෙනකොට, තරගකාරීත්වය සමාජය තුළ වැඩිවෙනවා. තරගකාරීත්වය වැඩිවෙනවාය කියන්නේ ලෝභ, ද්වේශ, මෝහ අකුසල් මූලයන් වැඩෙනවාය කියන කාරණයයි. දරුවෙක් මහපාරේ කහ ඉර පනින්නට ගියත්, පාසල් ප්‍රවාහන රථයේ ගමන් කරන විටත් ලෝභ සිතින් තරගකාරීත්වයේ යෙදෙන රියදුරු මාමලාගෙන් වෙන්න පුළුවන් අනතුරු දිනෙන්දින ම වැඩිවෙනවා. මෙවැනි අනතුරුවලින් යම් පමණකට හෝ මිදීමට මෛත්‍රී භාවනාව දරුවන්ට උපකාර වෙනවා.

ශ්‍රද්ධාවෙන්, සීලයෙන් දුර්වලවෙන සමාජයක අන්‍ය ශීලවෘතවල වර්ධනය අනිවාර්යයෙන්ම සිදුවෙන දෙයක්. යන්ත්‍රමන්ත්‍ර, කොඩිවින, වශී ගුරුකම් වැනි තිරස්චීන ධර්මයන් හේතුවෙන්, අමනුෂ්‍යයින්ගෙන්

ද, අමනුෂ්‍යයින් සේ හැසිරෙන මනුෂ්‍යයින්ගෙන් ද දරුවන්ට අනතුරු සිදුවෙන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වගේමයි, තිරිසන් සතුන්ගෙන් දරුවන්ට සිදුවන අනතුරු වර්තමානයේ වැඩිවෙමින් පවතිනවා. මදුරුවන්ගෙන් බෝවෙන ඩෙංගු උණ, බරවා, පිස්සු බල්ලන්ගෙන් හැදෙන ජලභීතිකා, මී උණ වැනි මාරාන්තික රෝගයන් ළමා පරපුර ඉදිරියේ බරපතල අනතුරු හැටියට මතු වී තිබෙනවා. වර්තමාන සමාජයේ ආහාර, අතුරුපස, පළතුරු නිෂ්පාදනයේ දී බහුල වශයෙන් සිදුවෙන වසවිස, රසකාරක, උවදුරු ළමා පරපුර ඉදිරියේ අභියෝගයක්ව පවතිනවා. කුඩා දරුවෙක් කෙසෙල් ගෙඩියක් අනුභව කළත් අනතුරක අවධානමක් තුළයි ජීවත් වෙන්නේ. තිරිසන් සතුන් හේතුවෙන්, වර්තමාන වසවිස ආහාර සංස්කෘතිය හේතුවෙන් ඇතිවෙන වසවිසෙන් වන හානිවලින් මිදීමටත්, මෛත්‍රිය පුහුණු කිරීමෙන්, දරුවන්ට හැකියාව යම් පමණකට ලැබෙනවා. මෛත්‍රිය පුහුණු කරන දරුවා තුළ මෝදුවෙන කුසල් ශක්තිය, අකුසල් විපාකයන් අනතුරු යටපත් කොට, දරුවාට ආරක්ෂාව සලසා දෙනවා.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවෙක් කොයි ආකාරයට ද මෛත්‍රී භාවනාව ජීවිතයට එකතුකොට ගත යුත්තේ?

පාසල් දරුවෙක් නිරතුරුවම, මම සුවපත් වේවා, නිදුක් වේවා, නිරෝගී වේවා කියලා, තමා තමාට මෙත් සිත පතුරුවාගන්න ඕනේ. තමා තමාට මෙත් සිත පතුරුවාගන්නේ, මම සුවපත් වේවා කියලා, වචනවලින් මෙනෙහි කරලා පමණක් නම් නොවේ.

වර්තමානයේ පාසල් දරුවන්, මම සුවපත් වේවා කියලා වචනවලින් කියනවා. සිතෙන් මෙනෙහි කරනවා. නමුත් ක්‍රියාවෙන් තමා තමාට මෛත්‍රී කරන්නේ නැහැ. පින්වත් දරුවන් මම සුවපත් වේවා, නිදුක් වේවා, නිරෝගී වේවා යැයි කියලා, මෙනෙහි කරලා, සම්බුද්ධ පූජාවන්ට, වන්දනාවන්ට අලස වෙනවා නම්, අම්මා තාත්තාට අකීකරුකම් කරනවා නම්, ගුරුදෙගුරුන්ට අකීකරුකම් කරනවා නම්

අධ්‍යාපන කටයුතු අලසව සිදුකරනවා නම්, නරක යාළුවන් ආශ්‍රය කරනවා නම්, තමා තමාට නරක්මයි නපුරක්මයි සිදුකොට ගන්නේ.

පින්වත් පාසල් දරුවන්, තමා තමාට මෙත් සිත පතුරුවා ගන්නේ, මුලින් ම බෞද්ධ දරුවෙක් නම්, බුදුරජාණන් වහන්සේට කීකරු වෙන්න ඕනේ. ක්‍රිස්තියානි දරුවෙක් නම්, තම ආගමික නායකයාණන් වන ක්‍රිස්තුස් වහන්සේට කීකරු වෙන්න ඕනේ. බුදුරජාණන් වහන්සේට කීකරු වුණා වෙන්නේ, අම්මා තාත්තාගේ බලකිරීමට බුද්ධ වන්දනාවන් සිදුකිරීමෙන් නොවේ. පුරුද්දක් හැටියට උදෑසන පාසලේදී, පින්වත් විදුහල්පතිතුමා ගුරු මණ්ඩලය ඉදිරියේ සම්බුද්ධ වන්දනාවන් සිදු කිරීමෙන් පමණක් නොවේ. බුදුරජාණන් වහන්සේ දරුවෙක් තුළ තිබිය යුතු යැයි දේශනා කළ ධර්මයන්, පින්වත් දරුවන් ජීවිතයට එකතු කොට ගැනීම තුළින්මයි.

දිනක් බුදුරජාණන් වහන්සේ පිණ්ඩපාතයේ වඩිනකොට, දරුවන් පිරිසක් කෝටුවක් අරගෙන සර්පයෙකුට හිංසා කරනවා. බුදුරජාණන් වහන්සේ දරුවන්ගේ මේ සත්ව හිංසාව දැකලා එම දරුවන්ගෙන් ප්‍රශ්නයක් විමසුවා. දරුවනේ, ඔබලා, ඔබලාගේ පාඩුවේ සිටින විට, යම් කෙනෙක් ඔබලාට හිරිහැර කරනවාට ඔබලා කැමතිද කියලා. දරුවන්ගේ පිළිතුර වුණේ, නැහැ කියලයි. එවිට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඔබට හිංසා කරනවාට ඔබලා අකමැති නම්, ඇයි මේ අහිංසක සර්පයාට හිංසා කරන්නේ කියලා. දරුවන්ට එම අවස්ථාවේදී තමයි මෛත්‍රිය, හිංසාව පිළිබඳව සතිය සිහිය ඇතිවුණේ.

බුදුරජාණන් වහන්සේ පින්වත් දරුවන් තුළින් මුලින් ම බලාපොරොත්තු වුණේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවවත් සීලයවත් නොවේ. බුදුරජාණන් වහන්සේ දරුවන් තුළින් මූලිකව ම බලාපොරොත්තු වූයේ මෛත්‍රියයි. දරුවෙක් ශ්‍රද්ධාව සීලය ජීවිතය තුළින් මතුකොටගන්න ප්‍රමාද වෙන්න පුළුවන්, නමුත් මෛත්‍රී චිත්තය ඕනෑම දරුවෙකුට ජීවිතයට මතුකොට ගන්න පහසුයි. මුලින් ම මෛත්‍රිය මතුකොටගන්න. දරුවා දෙවැනිව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, සීලයත් ජීවිතය තුළින් මතුකොට ගන්න දක්ෂ වෙනවා. මෛත්‍රිය බෞද්ධ, අබෞද්ධ හැම දරුවෙකුගේ ම අයිතියක් වෙනවා.

පින්වත් දරුවන් මෙත් සිත පුහුණු කරන කොට, කීකරු, සුවච, නිහතමානී දරුවෙක් වෙනවා. තමා අනුන්ට හිංසා නොකරන, තමා තමාට හිංසා නොකරගන්න දරුවෙක් වෙනවා.

පුංචි රාහුල ස්වාමීන් වහන්සේ, සෑම උදෑසනක ම, වැලි මිටක් අතට අරගෙන ප්‍රාර්ථනාවක් කරනවා, මට අද දවසේ මාගේ අතේ ඇති වැලි කැට ප්‍රමාණයට වැඩිහිටියන්ගෙන් අවවාද අනුශාසනා ලැබේවා කියලා. බලන්න, මෛත්‍රී චිත්තය තුළින් උපන් පුංචි රාහුල ස්වාමීන් වහන්සේගේ නිහතමානීභාවය. නමුත් වර්තමානයේ පින්වත් දරුවන්, මහපොළොවෙන් වැලි මිටක් අතට ගත්තොත්, එම වැලි මිට බිම දැමුවාට පසුව දෑත් හොඳින් සෝදා ගන්න ඕනේ. මොකද, වර්තමානයේ මහ පොළොව විෂබීජවලින් දූෂණය වෙලයි තිබෙන්නේ. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටිය කාලයේ හේතුඵල ධර්මයන් නිසාම මහපොළොව විෂබීජ රහිතයි.

බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළ වෙන්නේ කාලය, දීපය, දේශය, කුලය, මව කියන පස්මහ බැලුම් බලලයි. බුදුරජාණන් වහන්සේ ඇතුළු ශ්‍රාවකයින් වහන්සේලාගේ අතීත පින් ශක්තිය, කුසල් ශක්තිය නිසා ම පිරිසිදු පරිසරයක් ස්වාභාවිකව ම පිහිටනවා. සූත්‍රගත ධර්මයේ තැන් කිහිපයකම සඳහන් වෙනවා, බුදුරජාණන් වහන්සේ මහ පොළවේ පස් මිටක් අරගෙන, ඇට්ටේරියා කොළ මිටක් අරගෙන, උපමාවන් දක්වූ අවස්ථාවන්. නමුත් වර්තමානයේ මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසාම, මුළු මහපොළව ම විකෘතියක් බවට පත්වෙලයි තිබෙන්නේ. එම නිසා දරුවන් පස් වැලි අතගෑමේදී ප්‍රවේශම් වෙන්න ඕනේ.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවෙක් බුදුරජාණන් වහන්සේට කීකරු වුණා කියන්නේ කුමන කරුණකින් ද?

පින්වත් දරුවන් නුවණින් මෙනෙහිකොට දකින්න ඕනේ, රටේ තිබෙන ළමා නිවාසවල අම්මලා, තාත්තලා අහිමි දරුවන් කොච්චර නම් ඉන්නව ද, දෙමාපියන් නැති දරුවන් ජීවත්වෙන ලෝකයක,

ඇයි පින්වත් ඔබට රටක් වටිනා අම්මා, තාත්තා, දේපලක් ලැබුණේ කියලා. දරුවන්ට ආදරය, කරුණාව, සැපසම්පත්, ප්‍රණීත ආහාර, අධ්‍යාපන පහසුකම් මේ සියල්ල දරුවන් කැමති කරන ආකාරයට මේ ජීවිතයේදී ලැබෙන්නේ, බුදුරජාණන් වහන්සේ නිසාමයි. දරුවන් මේ ජීවිතයේදී ලබන සෑම සැප වේදනාවක් ම අතීත ජීවිතවල ඔබ ම පටිච්චසමුප්පන්නව රැස්කොට ගත් පින සහ කුසලයේ ඵලයන්මයි. ඔබ පෙර ජීවිතයේදී බුදුරජාණන් වහන්සේට අකීකරුව ජීවත් වෙච්ච දරුවෙක් නම්, ඔබට මේ ලස්සන ළමා ජීවිතය ලැබෙන්නේ නැහැ. පින්වත් දරුවන් දක්‍ෂවෙන්න ඕනේ, තමන් ලබන සෑම අධ්‍යාපන ජයග්‍රහණයක් ඉදිරියේ ම, තමන් ලබන සෑම සැප වේදනාවක් ඉදිරියේදි ම බුදුරජාණන් වහන්සේව සිහිපත් කොට ගන්න. අම්මා දරුවන්ට ලස්සන ඇඳුමක් අරගෙන දෙනකොට, හැමෝම ඔබට ගරුකරනකොට, පින්වත් දරුවන් දක්‍ෂ වෙන්න, මම කැමති සෑම දෙයක් ම මට ලැබෙන්නේ පෙර පින් නිසා, මට පින් සිදුකරගන්න මාර්ගය පෙන්වා දුන්නේ බුදුරජාණන් වහන්සේය කියන අර්ථය දකින්න. බුදුරජාණන් වහන්සේට හදවතින් ම වන්දනා කරමිනුයි ශිෂ්‍ය ජීවිතයේදී ඔබ ලබන සෑම සතුටක් ම භුක්ති විඳිය යුත්තේ.

මෙය සටහන් තබන භික්ෂුවට මේ මොහොතේ සැපයට අදාළ යම් දෙයක් ලැබී තිබෙනවා නම්, ඒ සෑම සැප වේදනාවකට ම එක ම හේතුව බුදුරජාණන් වහන්සේට දැක්වූ කීකරුභාවයයි. මම අතීතයේ බුදුරජාණන් වහන්සේට අකීකරු වූ දරුවෙක් නම්, මට මේ මොහොතේ ඉන්නට වෙන්නේ බන්ධනාගාරයක, සිරගෙදරක, තිරිසන්, ප්‍රේත ලෝකයක. එම නිසා භික්ෂුවක් වශයෙන්, මගේ භික්ෂු ජීවිතයේ සෑම මොහොතකදී ම බුදුරජාණන් වහන්සේට කෘතවේදීභාවය දක්වනවා. එම නිසා පින්වත් දරුවන් ඔබේ සැපයට, ජයග්‍රහණයන්ට හේතුව සකස්කොට දීමට මුල් වූ බුදුරජාණන් වහන්සේට කීකරුවෙන්න දක්ෂ වෙන්න ඕනේ.

බුදුරජාණන් වහන්සේට අකීකරු වෙච්ච දරුවන් සමාජයේ ගොඩක් ජීවත් වෙනවා. බුදුරජාණන් වහන්සේට අකීකරු වෙන්න යම් දරුවෙකුට සිත සකස් වෙන්නේ අතීත සාංසාරික පුරුදු නිසාමයි. බුදුරජාණන්

වහන්සේ මුලින් ම තමා තමාට මෛත්‍රිය කරගන්න කියලා දරුවන්ට දේශනා කොට තිබියදී, පාසල් කාලයේදී තමා තමාට මෛත්‍රිය නොකරගත් දරුවන් තමයි, බන්ධනාගාර ගතවෙලා, සිරගතවෙලා, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවෙලා වර්තමානයේ ජීවත්වෙන්නේ, මහා අව් රශ්මියේ දහදිය හෙලමින්, දුක වැඩි රැකීරක්ෂා කරමින් ජීවත් වෙන්නේ. මේ හැම කෙනෙක් ම අතීතයේ තමන්ට ලැබුණ පාසල් ජීවිතයේදී තමා තමාට මෛත්‍රී නොකරගත් දරුවන්මයි. ළමා කාලයේදී තමා තමාට මෙත් සිත් පැතිරවූයේ නැති නිසා ම, තමා තමාට හිංසාකොට ගන්නවා. සැපයෙන් යම් පමණකට බැහැර වෙලා දුක ම උරුමකොට ගන්නවා. අතීත පාසල් ජීවිතයේදී තමා තමාට මෛත්‍රිය කොටගත් දරුවන් තමයි වර්තමාන සමාජයේ නායකයන්, පාලකයන්, විධායකයන්, වෘත්තිකයන් හැටියට දුක යම් ප්‍රමාණයකට හෝ යටපත් කරගෙන සැපය තුළ ජීවත් වෙන්නේ.

බුදුරජාණන් වහන්සේ කෙරෙහි කීකරුභාවය ඇතිකොටගෙන, තමා තමාට මෙත් සිත පතුරුවන දරුවා, තමාගේ කායික පිරිසිදුභාවය ඇතිකොටගෙන, වැඩිහිටියන්ගේ බලකිරීමකින් තොරව ම, විහාරස්ථානයේ වේවා, නිවසේදී වේවා, පාසලේදී වේවා, සම්බුද්ධ වන්දනාවන්ට, ආගමික කටයුතුවලට නොපැකිළිව ඉදිරිපත් වෙන්න ඕනේ. තමා තමාට මෛත්‍රිය කළා වෙන්නේ, තමන්ගේ පිනේ ශක්තිය වැඩි කොටගැනීමෙන් පමණක්මයි. ඉගෙනගන්න දක්ෂ, කීකරු දරුවෙක්, තම දෙමාපියන් සමග භික්ෂුව මුණගැසීමට පැමිණිලා, භික්ෂුවගෙන් මෙහෙම ප්‍රශ්නයක් විමසුවා. ස්වාමීන් වහන්ස, මම සැම හැන්දෑවක ම තනිව ම බුදුරජාණන් වහන්සේට මල්පහන් පූජා කරලා, සම්බුද්ධ වන්දනාවන් සිද්ධ කරනවා. අම්මා, තාත්තා බලකරලා නොවේ, මම සවසට සම්බුද්ධ පූජාවන් සිදු කරන්නේ. ස්වාමීන් වහන්සේ කියන්න, මම ගිය ජීවිතයේ කවුරුන් වෙලා ඉන්න ඇතිද කියලා. භික්ෂුව එම දරුවාට ප්‍රකාශ කළේ, දරුවෝ, ඔබ ගිය ජීවිතයේ හුඟක් දුරට, පුංචි සාමණේර හාමුදුරුනමක් වෙලා ඉන්න ඇතිය කියලා. ඒ අතීත සාංසාරික පුරුද්දමයි, පුංචි වයසේදී ම බුදුරජාණන් වහන්සේ කෙරෙහි මෙවැනි කීකරුභාවයක් සකස් වෙන්න බලපාන්න ඇත්තේ කියලා. ළමා වයසේදී ම බුදුරජාණන් වහන්සේ කෙරෙහි

ඇතිකොට ගන්නා කීකරුභාවය දරුවන්ගේ අතීත අකුසල් යටපත් කොට දමා, කුසල් පක්ෂය මතුකොටගෙන, අධ්‍යාපනයේ මෙන්ම, ගුණධර්මයන්ගෙන් ශක්තිමත් දරුවෙක් බිහිකිරීමට එක ම මාර්ගය වෙනවා.

බුදුරජාණන් වහන්සේට කීකරුභාවය තුළින් තමා තමාට මෙත් සිත පතුරුවන දරුවා මීළඟට කුමක් කළ යුතු ද?

බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇතිකොටගත් කීකරුභාවය තුළින් තමා තමාට මෛත්‍රී කිරීමේ මාර්ගයට අවතීර්ණ වූ, දරුවා මීළඟට කළ යුත්තේ, පින්වත් දරුවෙක් වශයෙන් ළමා කාලයේදී ම, බුදුරජාණන් වහන්සේ කෙරෙහි කීකරුභාවය ඇතිකොට ගෙන, මා කෙරෙහි මෙත් සිත පතුරුවා ගැනීමට මට හැකියාව, ශක්තිය ලැබුණේ, මම මොන තරම් පින්වත්ත දරුවෙක් ද කියන කාරණය ධර්මානුකූලව මතුකොටගෙන, මම මෙච්චර පින්වන්ත නම්, මාව මේ ලෝකයට බිහිකරපු, මාව ලොකුමහත් කරපු මගේ අම්මා, තාත්තා මොන තරම් පින්වන්ත විය යුතු ද කියන කාරණය දකිමින්, දෙමාපියන්ට මෙත් සිත් පතුරුවන්න ඕනේ.

අතීතයේ මෛත්‍රී භාවනාව පුහුණු කිරීම නිසා ම, මහා බ්‍රහ්මයාට පමණක් පොදු වූ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා, ගුණයන් තුළිනුයි, දෙමාපියන් දරුවන් දෙස බලන්නේ. පුංචි පාසල් දරුවන් දවසකට එක වතාවක්වත්, දෑස් දෙක පියාගෙන, තම අම්මා, තාත්තා තුළින් මහා බ්‍රහ්මයා දකින්න දක්ෂවෙන්න ඕනේ. බුදුරජාණන් වහන්සේ මහා බ්‍රහ්මයා කියන අර්ථය පින්වත් දරුවන්ගේ නිවසට ම ගෙනත් දීලා තිබෙන්නේ, දරුවන්ට පින් සිද්ධකොට ගන්නමයි. සමහර දරුවන් දෙමාපියන් සමග කටයුතු කිරීමේදී, දෙමාපියන්ගේ අවවාද ඉදිරියේ දෙමාපියන් සමග කේන්ති ගන්නවා. එක අම්මා කෙනෙක් වරක් ප්‍රකාශ කළා, තම පාසල් දියණිය කේන්තියෙන් මට ගහනවා කියලා එම අම්මා තමාගේ හිසකෙස් රොද පෙන්වා භික්ෂුවට ප්‍රකාශ කළේ, දියණිය කේන්තිගිය වෙලාවට හිසකෙස්වලින් ඇදීම නිසා හිසකෙස් ගැලවිලා ගිහිල්ලා කියලා. දරුවන්ගේ අකීකරු

හැසිරීම් නිසා කඳුළු හෙලන දෙමාපියන් සමාජයේ හුඟක් සිටිනවා. අම්මා, තාත්තා දරුවන් කෙරෙහි ඇති මෙත් සිත නිසා ම, දෑසින් කඳුළු නොහෙලා, හදවතින් හඬනා දෙමාපියන් සමාජයේ හුඟක් සිටිනවා. අම්මා, තාත්තාට පුළුවන්, දරුවන් කෙරෙහි ඇති මෙත් සිත නිසා ම, දරුවාට නරකක්, අපකීර්තියක් වෙයි කියන බිය නිසා ම දරුවන්ගෙන් දෙමාපියන්ට සිද්ධවෙන ඕනෑම අකීකරුභාවයක් ලෝකයට සඟවාගෙන, දෑසින් කඳුළු නොහෙලා, හදවතින් හඬමින් ජීවත්වෙන්න. මෙය අම්මා, තාත්තා සතු උපේක්ෂාවේ මහා බ්‍රහ්ම ගුණයක්. දරුවන් දෙමාපියන්ගේ මේ මහා බ්‍රහ්ම ගුණයන් හඳුනා නොගන්නා නිසා ම, මහා බ්‍රහ්ම ගුණයන් හදවතින් හඬවා, අප්‍රමාණ අකුසල් සිදුකර ගන්නවා.

දරුවන් හුඟක් වෙලාවට දෙමාපියන් සමග කේන්තිගන්නේ අම්මා, තාත්තා වැරදියි, මම හරියි කියන දෘෂ්ටියෙන්. දරුවන් තුළ ඇතිවෙන, අම්මා, තාත්තා වැරදියි, මම හරිය කියන දෘෂ්ටිය, බරපතල අපායගාමී දෘෂ්ටියක්. පින්වත් දරුවන් සැමවිට ම සිතන්න ඕනේ, දරුවන් වන ඔබ හරි නම්, ඔබ නිවැරදි නම් ඔබ වැනි නිවැරදි දරුවෙක් ලෝකයට බිහිකරපු අම්මා, තාත්තා ඔබට වැඩිය නිවැරදිය, දක්ෂය කියන කාරණය දකින්නට. අම්මා, තාත්තා දෙවැනි තැනට දමා, දරුවන් මොන ම හේතුවක් නිසාවත්, මම නිවැරදිය කියන මුල්තැනට එන්න උත්සාහ ගන්න එපා. එය බරපතල මෝහ මූලික ක්‍රියාවක්.

පින්වත් දරුවන් දෙමාපියන්ගේ අවවාදයන් ඉදිරියේ, කේන්තියෙන් අම්මා, තාත්තාට අකීකරු වීම්, චෝදනා කිරීම් පසෙක තබා අම්මා, තාත්තාගේ නිවැරදිභාවය නොදකින ඔබේ වැරදිභාවය, නිවැරදි කරගන්නයි දරුවන් දක්ෂ විය යුත්තේ. දෙමාපියන් පින්වත් දරුවන්ට අවවාදයන් සිදුකළත්, ටිකක් කේන්ති අරගෙන බැන්නත්, පින්වත් දරුවන් අම්මා, තාත්තාට සුවපත් වේවා කියලා මෙත් සිත පතුරුවන්න. දෙමාපියන්ට එකටඑක කියාගෙන යන්න එපා. එවිට එම දරුවා දෙමාපියන්ට මානසිකව හිංසා කළා වෙනවා. තමා තමාට හිංසා කොටගත් දරුවෙක් වෙනවා.

ගෙදර බුදුන් අම්මාය කියලා, බුදුරජාණන් වහන්සේ කොතනදිවත්, දේශනා කොට නැහැ. බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට, බිහිකරන්නේ, අම්මා කෙනෙක් කියන අර්ථයයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. බුදුරජාණන් වහන්සේ නමක්, පසේ බුදුරජාණන් වහන්සේ නමක්, රහතන් වහන්සේ නමක් ලෝකයට බිහිකරන අම්මා, තාත්තා කියන අර්ථයට පින්වත් දරුවන් කවදාකවත් කඳුළක් දුකක් දෙන්න එපා. පින්වත් දරුවන් දැකලා තිබෙනවා, වතුර භාජනයක් රත්කරන කොට ජල වාෂ්ප ඉහළට නැගෙනවා. වතුර රත්වීමෙන් ජල වාෂ්ප සකස් වෙනවා වගේ, අම්මා, තාත්තාගේ මහා බ්‍රහ්ම ගුණයන් වන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණයන් උණුවෙමිනුයි දෙමාපියන්ගේ දෑසට කඳුළු නැගෙන්නේ. තම දෙමාපියන්ගේ දෑසට තමන් නිසා කඳුළක් නැඟුණොත්, එම කඳුළ තුළින් සතර අපායේ බිය දකින්න දරුවන් දක්ෂවෙන්න ඕනේ.

මෙය සටහන් තබන භික්ෂුවගේ අම්මා, තාත්තා දරුවන් හැටියට අපිව පෝෂණය කරන්න, අධ්‍යාපනය ලබාදෙන්න මොන තරම් කැපවීමක් සිදුකළා ද, මොන තරම් දහදිය වැගුරුවා ද කියන කාරණය දරුවෙක් වශයෙන් මම දන්නවා. මගේ පියා මධ්‍යම පාන්තික ව්‍යාපාරිකයෙක්. දෙමාපියන් කළ කැපවීම ගැන අවශ්‍ය නම් භික්ෂුවට පොතක් ලියන්න පුළුවන්. එම පොතේ අර්ථය වචන කිහිපයකට කැටිකොට ලියනවා නම්, භික්ෂුව මෙසේ සටහන් තබනවා. පින්වත් අම්මේ තාත්තේ, දරුවෙක් වශයෙන් මම ගින්දරක් නම්, ඔබ දෙපලයි මට ජලයක් වූයේ කියලා. මේ සියලු කැපවීම දරුවන් වෙනුවෙන් සිදුකරලා, දරුවන් වන අපිව ලෝකයට ඔසවා තබලා, අපේ අම්මා තාත්තලා භවයේ ඈතින් ඈතට යන්න ගියා, අනාගතයේ නැවත, අම්මලා තාත්තලා වෙලා ලෝකයට දරුවන් බිහිකරන්න.

තමන්ට අයිති නැති ලෝකයක, තමන්ට අයිති නැති මාතෘත්වයක්, පීතෘත්වයක් දරාගෙන, තමන්ට අයිති නැති දරුවන් ලෝකයට බිහිකරන අම්මා තාත්තා කියන්නේ, ප්‍රතිඋපකාරයක් බලාපොරොත්තු වීමෙන් තොරවූ සැබෑ ම මනුෂ්‍යත්වයේ සත්පුරුෂභාවයේ මාතෘත්වයයි, පීතෘත්වයයි. ඒ උතුම් මාතෘත්වයේ පීතෘත්වයේ ගුණයන් කියනකොට,

ගුණයන් හිතනකොට, පින්වත් ඔබේ දෑසට, කඳුළු ගලා එන්නේ, මව් පිය ගුණයන් ඉදිරියේ, ඇස නැමති සතර මහා ධාතුව, මනස නැමති සතර මහා ධාතුව කම්පා වෙන නිසාමයි. සතර මහා ධාතුව කම්පා කරවන්න පුළුවන් ගුණයක් දෙමාපියන්ට තිබෙනවා. එවන් ගුණයන් ලොවට සඟවාගෙන ජීවත්වෙන, ඔබේ දෙමාපියන්ට, පින්වත් දරුවන් කඳුළක් දෙන්න නම් එපා. එම කඳුළ දරුවන්ට ගින්දරක් ම වෙනවා. දෙමාපියන් දෑසේ කඳුළු හංගාගෙන, හදවතින් හඬන නිසා ම, අම්මා තාත්තා බාහිරින් දකලා තේරුම් ගන්න හරි ම අපහසුයි. ඒ අපහසුතාවය වැඩිවෙන තරමට, නොහඬන අම්මලා තාත්තලා නිසා, අකීකරු දරුවන් බරපතල අකුසල් සිදුකොට ගන්නවා.

පින්වත් දරුවන් දෙමාපියන්ට අකීකරු වුණොත් එම දරුවන් නැවත මනුෂ්‍ය මව්කුසක උපතක් ලැබීම දුර්වල දෙයක් වෙනවා. දෙමාපියන්ට හිංසා කරන දරුවෝ නැවත උපදින්නේ බිත්තරයක, තිරිසන් මව්කුසක, එසේත් නැත්නම් ඕපපාතික ප්‍රේත නිරය වැනි සතර අපායකයි. දෙමාපියන්ට කීකරු දරුවන් පමණයි, නැවත යහපත් මනුෂ්‍ය මව්කුසක, දිව්‍ය බ්‍රහ්ම කුලවල උපත සකස්කොට ගන්නේ.

පින්වත් ඔබේ අම්මා තාත්තා කියන්නේ ධර්මතාවයක්. පින්වත් දරුවෙක් අම්මාගේ කුසේ පිළිසිඳ ගන්නේ '**සංස්කාර පච්චයා විඤ්ඤාණ**' කියන හේතුඵල ධර්මතාවය තුළින්. මව්කුසට බැසග න්නා විඤ්ඤාණය හේතුවෙනුයි නාමරූප ධර්මයන්, සළායතන ධර්මයන් සකස්වෙන්නේ. දරුවන්ගේ අතීත සංස්කාර ශක්තීන්ට ගැලපෙන ස්වභාවයටයි, ඔබලාට මේ ජීවිතයේ දෙමාපියන් මුණග ැසිලා තිබෙන්නේ, එම නිසා දෙමාපියන් උතුම් ධර්ම රත්නයේ ම ඵලයක් හැටියට දකින්න දරුවන් දක්ෂ වෙන්න. අම්මා තාත්තා කියන උතුම් ධර්මයේ ඕපනයික ගුණය තමයි, දෙමාපියන් සතු මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන්. දරුවන් වෙනුවෙන් දෙමාපියන් සතු, මේ උතුම් ඕපනයික ගුණය සඟවන්න බැහැ. අම්මා තාත්තාට දරුවෙක් අකීකරු වෙනවා කියන්නේ, උතුම් ධර්මරත්නයට අකීකරු වෙනවාය කියන කාරණයයි.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට පෙරාතුව ආනන්ද ස්වාමීන් වහන්සේට දේශනා කරනවා, මගේ පිරිනිවීමෙන් පසුව ශාස්තෘන් වහන්සේ බවට පත්වෙන්නේ උතුම් ධර්ම විනයයි කියලා. එසේ නම් වර්තමානයේ ජීවමාන ශාස්තෘන් වහන්සේ කියන්නේ උතුම් ධර්ම රත්නයයි. දෙමාපියන් කියන්නේ උතුම් ධර්ම රත්නයට අර්ථයක් නම්, පින්වත් දරුවන්, දෙමාපියන්ට, හිංසා කිරීම, අකීකරුවීම ජීවමාන ධර්ම විනය නැමති, ශාස්තෘන් වහන්සේට කරන හිංසනයක්, අකීකරුවීමක් වෙනවා. බලන්න මොන තරම් සියුම් ආකාරයට, මෙත් සිත නැති දරුවන් නිසා, බරපතල අකුසල් සිද්ධවෙන්න පුළුවන් ද කියලා. ළමා සමාජය මතුකොට නොදකින මෙවැනි, නිතිපතා සිදුවන බරපතල අකුසල් නිසාමයි සමාජය දිනෙන් දිනම, හැමෝගේ ම සිත් තුළ ප්‍රශ්නාර්ථයක් ඇතිකොට දෙමින් පිරිහීමේ දිශාවට ගමන් කරන්නේ.

අම්මා තාත්තා සතුටු කරන්නේ කොහොමද කියන ඉව, මෙත් සිත පුහුණු කරන දරුවෙකුට තිබෙන්න අවශ්‍යයි. දෙමාපියන් සතුටු වෙන්නේ ඔබ දෙමාපියන්ට කීකරුව සිටින විට නම්, ඔබ දෙමාපියන්ට කීකරු වෙමින් දෙමාපියන්ව සතුටු කරනවා. දෙමාපියන් කැමති ඔබ අධ්‍යාපන කටයුතු උද්‍යෝගයෙන් ඉලක්කගත අරමුණින් කරනවා දකින්න නම්, ඔබ දෙමාපියන් සතුටු වන ආකාරයට අධ්‍යාපන කටයුතු සිදුකරනවා. දෙමාපියන් කැමති, පින්වත් දරුවන් තෙරුවන් කෙරෙහි වත්පිළිවෙත් කරනවා දකින්න නම්, පින්වත් දරුවන් තෙරුවන් කෙරෙහි කළ යුතු වත්පිළිවෙත් අකුරට සිදුකරමින් දෙමාපියන් සතුටු කරනවා. අම්මාගේ මව්කුසේ දරුවෙක් පිළිසිඳ ගත්තාය කියලා මුල්වරට දැනගත්ත දවසේ, ඒ අම්මා තාත්තා මුලින් ම යන්නේ ගමේ පන්සලේ බෝධීන් වහන්සේ ළඟට. දෙමාපියන් බෝධි පූජාවක් තබලා, මව්කුසේ පිළිසිඳ ගත් දරුවාව බුදුරජාණන් වහන්සේට, බෝධීන් වහන්සේට භාරකරනවා. අම්මා තාත්තා කුස පිළිසිඳ ගත් දරුවාව, බුදුරජාණන් වහන්සේට භාරකරන්නේ දරුවාට අනතුරක් නරකක් නොවේවා කියන මෙත් සිතින්මයි. පින්වත් දරුවන් වන ඔබලා, ඔබලාගේ දෙමාපියන් විසින් බුදුරජාණන් වහන්සේට භාරකොට ලෝකයට බිහිකරපු දරුවෝ. දෙමාපියන්ගේ ඒ අහිංසක මෙත් සිත, ඔබේ කීකරුභාවය තුළින්

ශක්තිමත් කොට දීමට දරුවන් දක්ෂ විය යුතු යි. එවිට පින්වත් දරුවන් දෙමාපියන්ට මෙත් සිත පැතිරුවා වෙනවා. එසේ නොවී පින්වත් දරුවන් උදෑසන පාසලේ සම්බුද්ධ වන්දනාවේ දී, සියලු සත්වයෝ සුවපත් වේවා යැයි කියලා, ගෙදර ඇවිත් දෙමාපින්ගේ සිත් රිදවනවා නම් ඔබ දෙමාපියන්ටත්, ඔබටත් හිංසනයක්මයි සිදුකොට ගන්නේ.

ස්වාමීන් වහන්ස, පින්වත් දරුවන් තමන්ට ශිල්ප කියලා දෙන පින්වත් ගුරුමහත්ම මහත්මීන්ට මෙත් සිත පතුරුවන්නේ කෙසේද?

පින්වත් දරුවන් තමන්ට අකුරු කියලා දෙන, පින්වත් ගුරුතුමන්ලාට ගෞරවයෙන්, කීකරුභාවයෙන් කටයුතු කරන්න ඕනේ. දරුවන් පන්තියේදී ගුරුතුමාට අකීකරු නම්, ගෙදර වැඩ නොකරගෙන පැමිණෙනවා නම්, ළමයින් සමඟ සණ්ඩුවෙනවා නම්, අපිළිවෙළට ඇඳුම්පැළඳුම් පළඳිනවා නම්, නිරතුරුව ම පින්වත් ගුරුතුමන් විසිරුණු සිතින් තමයි දරුවන් ඉදිරියේ සිටින්නේ. එවිට දරුවන් තම පින්වත් ගුරුතුමාට මෙත් සිත වැඩුවා වෙන්නේ නැහැ, පින්වත් ගුරුතුමාට හිංසා කළා වෙනවා. ගුරුතුමාට හිංසා කිරීම නිසා ම, දරුවන් වන තමනුත් හිංසාවට ලක් වුණා වෙනවා. පින්වත් දරුවන් තම ගුරු මණ්ඩලයට කීකරු භාවයෙන් කටයුතු කරන මොහොතක් පාසා, ඔබලා පින්වත් ගුරු මණ්ඩලයට මෙත් සිත පැතිරුවා වෙනවා.

මෙය සටහන් තබන භික්ෂුව පාසල් ජීවිතය ගත කළේ කොළඹ වෙස්ලි විද්‍යාලයේ. ඒ අතීත පාසල් ජීවිතය ගැන සිහිපත් වෙන විට, වර්තමානයේ වයෝවෘද්ධභාවයෙන් පසුවෙන මට කිසිදු ආයාසයකින් තොරව ම, මට පළමුවැනි ශ්‍රේණියේ පටන් ම අකුරු කියලා දුන්න, පෙරේරා ටීච, ස්ට්‍රෙම්බු ටීච, අමරතුංග ටීච, රොඩ්රිගු සර්, ප්‍රනාන්දු සර්, නිමල් සර්, ලින් ද මෙල් සර්, එඩ්මා සර්, තිස්ස ආරච්චි ටීච, ගාමිණී සමරකෝන් සර්, විල්ෆඩ් වික්‍රමසිංහ සර්, වේලාරත්න සර්, කළුපහන සර්, ප්‍රේමදාස සර් මේ සත්පුරුෂ නම් වැල ආයාසයකින් තොරව මේ මොහොතේ මතකයට නැගෙන්නේ එතුමන්ලා තුළින්, අධ්‍යාපන ජීවිතයේදී ශිෂ්‍යයෙක් වශයෙන් මා ලැබූ

ශීලාචාර ගුණධර්මයන්ගේ පන්නරය මේ මොහොතේත්, මගේ භික්ෂු ජීවිතය තුළ කැටි වී තිබෙන නිසාමයි.

අතීත පාසල් ජීවිතයේදී, ශිෂ්‍යයෙක් වශයෙන් මම, පින්වත් ගුරු මණ්ඩලයේ සිත් රිදවූ අකීකරු ශිෂ්‍යයෙක් වුණා නම්, වර්තමානයේ මට මෙවැනි සටහනක් තබන්නට බැහැ. නමුත් පාසල් ජීවිතයේදී, ගෙදර වැඩ නොකිරීම නිසා, අකමැති විෂයන් මගහැර සිටීම නිසා ගුටිකාපු අවස්ථාවන් නම් ගොඩක් ශිෂ්‍ය ජීවිතය තුළ තිබුණා. එසේ නොවන්නට, කවදාකවත් අකීකරුකමක් කරලා, පින්වත් ගුරු මහත්ම, මහත්මීන්ගේ සිත රිදවලා නැහැ. එදා පන්ති කාමරයේදී යම් ගුරු මහත්මයෙක් මට පහරක් ගැසුවා නම් දඬුවමක් කළා නම්, අවවාදයක් කළා නම්, දණගස්සලා තැබුවා නම්, ඒ සෑම ක්‍රියාවක් ම සිදුකළේ, මාව දක්ෂයෙක් කිරීමේ අරමුණෙන්මයි කියන කාරණය දැන් මට වැටහෙනවා. ඒ අහිංසක ගුරු සිත්වල, තම ගෝලයින්ට යහපතක් ම වේවා, දක්ෂයන් ම වේවා කියලා යම් බලාපොරොත්තුවක් තිබුණා නම්, එම බලාපොරොත්තු ඉටු කළාය කියන කාරණය, ශිෂ්‍යයෙක් වශයෙන් මම දකිනවා. ඒ නිසා ම ශිෂ්‍යයෙක් වශයෙන් මට අකුරු කියා දුන්න, ගුරු මණ්ඩලයට මෙත් සිත පැතිරවූ ශිෂ්‍යයෙක් වෙනවා. භික්ෂුව මේ සටහන තබන කොට, මට අධ්‍යාපනය ලබාදුන් පින්වත් ගුරු මහත්ම මහත්මීන් සමහරක් ජීවතුන් අතර නැහැ. ඒ සෑම පින්වත් ගුරු මෑණිවරුන්ට, පියවරුන්ට, පරලොව ජීවිතයේදී සැපය පිණිස, මේ උතුම් ධර්මදානමය පින් හේතුවෙන්න ඕනේ. නිරෝගිව, සුවපත්භාවයෙන් ජීවත්වෙන පින්වත් ගුරු මෑණිවරුන්ට, පියවරුන්ට නිදුක්, නිරෝගී, සුවපත්භාවය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

තමන්ට අයිති නැති දරුවන්, තමන් ලෝකයට බිහි නොකරපු දරුවන්, ලෝකයට ඔසවා තබන මාතෘත්වයයි, පීතෘත්වයයි ගුරුවරයා කියලා කියන්නේ. ගුරුවරයා කියන මාතෘත්වය, පීතෘත්වය තම ගෝලයින්ට පොවන මව්කිරි තමයි අධ්‍යාපනය කියන්නේ. පින්වත් ගුරුවරයා දරුවාට පොවන අධ්‍යාපනය නැමති මව්කිරෙන් තමයි දරුවාගේ දැනුම, බුද්ධිය, ශීලාචාරකම් පෝෂණය වෙන්නේ. වර්තමාන සමාජය තුළ, යම් බුද්ධිමය වටිනාකමක් ගොඩනැගී තිබෙනවා නම්, ශීලාචාර

ධර්මයන් ආරක්ෂා වී තිබෙනවා නම්, ඒ සැම ගුණාත්මක ධර්මතාවයක් ම, ගුරුවරයා නැමති මාතෘත්වය, පීතෘත්වය තම ශිෂ්‍යයින්ට පෙවූ අධ්‍යාපනය නැමති මව් කිරේ ඵලයක්මයි. දරුවා දෙමාපියන්ට අයිති බව ඇත්ත, නමුත් එම දරුවා උගතෙක් වී බිහිකරන, පහසුකම් සහිත, සදාචාරාත්මක ලෝකය අයිති ගුරුවරයාටයි. පින්වත් ඔබට, භික්ෂුව මේ සටහන් තබන්නේ, අතීතයේ ඒ ගුරු මාතෘත්වය, පීතෘත්වය මට පෙවූ අධ්‍යාපනය නැමති මව්කිරේ කටගෑමෙන්, මා ලැබූ ශීලාචාර හැදියාවන්ගේ ශක්තිය නිසාමයි. තමන්ට අයිති නැති දරු කැලක්, තම මව්කිරෙන් පෝෂණය කරන පින්වත් ගුරු මෑණිවරුන්ගෙන්, පියවරුන්ගෙන් මේ මොහොතේ, පන්ති කාමරයේ අධ්‍යාපනය ලබන පින්වත් ශිෂ්‍යශිෂ්‍යයාවන්ට, අනාගතයේ යම් දවසක, තම අතීත පාසල් ජීවිතය පිළිබඳව අතීතාවර්ජනයක යෙදෙන කොට, පින්වත් ඔබට සතුටුවෙන්න පුළුවන්, ආත්ම තෘප්තියක් ලබන්න පුළුවන් වෙන ආකාරයකට වර්තමානයේ පින්වත් දරුවන් අහිංසක ගුරු සිත නොරිදවා ශිල්ප හදාරන්න දක්ෂ වෙන්න ඕනේ.

සමාජය පිරිහීමෙන්, ගුරු වෘත්තිය පිරිහෙනවායි කියන කාරණය, ධර්මයට එකඟ නැහැ. ගුරු වෘත්තිය පිරිහීමෙන්, සමාජය පිරිහෙනවාය කියන කාරණයයි, ධර්මානුකූල වෙන්නේ. උතුම් සමාජ ධර්මතාවයන්, ශීලාචාර ධර්මයන් බිඳවැටීමට, අකමැති සෑම දෙමාපියන් ම, ගුරු වෘත්තියේ ගුණාත්මකභාවය ආරක්ෂාකොට ගැනීමට කැපවීම අත්‍යවශ්‍ය වෙනවා. මෙය දෙමාපියන් සහ දරුවන් යන දෙපාර්ශවයේ ම වගකීමක් වෙනවා. දරුවා දෙමාපියන්ට ගරුකරනවා වගේ ම, දරුවාත් දෙමාපියනුත් දෙදෙනා ම එකතු වී, ගුරුතුමාට, ගුරුතුමියට ගරු කළ යුතු වෙනවා. දෙමාපියන්ගෙත් දරුවන්ගෙත් ගුණාත්මකභාවය මතයි ගුරු වෘත්තියේ ගුණාත්මකභාවය රැඳී පවතින්නේ. දෙමාපියනුත් දරුවනුත් පින්වත් ගුරු සිත රිදවනවා නම්, ගුරු ගෞරවය ලබා නොදෙනවා නම්, දරුවා ගුරුවරයාට පමණක් භාරදී, දෙමාපියන් මඟහැර යනවා නම්, කලකිරීම් නිසා බිඳවැටෙන ගුරු මානසිකත්වයට දෙමාපියනුත් දරුවනුත් දෙපාර්ශවයම වගකිව යුතු වෙනවා. මේ දෙපාර්ශවයේ දුර්වලතාවයන් නිසා පින්වත් ගුරු සිත බිඳුණොත්, එය මුළු ගුණාත්මක සමාජ පදනමේ ම බිඳවැටීමේ ආරම්භය වෙනවා. මේ

බිඳවැටීම තුළ දෙමාපියන්, දරුවන් පමණක් නොව, ගුරු වෘත්තියේ ආත්මගරුත්වය ද සෝදාපාළුවට ලක්වෙනවා. පින්වත් දෙමාපියනුත්, ශිෂ්‍යයනුත්, පින්වත් ගුරු මහත්ම මහත්මීන්ට අකීකරු නොවී කටයුතු කිරීමෙන්, ගුරු සිත නොරිදවීමෙන්, තම ගුරුවරුන්ට මෙත් සිත පැතිරුවා වෙනවා.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවෙක් බාහිර සමාජයට මෙත් සිත පතුරුවන්නේ කෙසේද?

පින්වත් දරුවන්ගේ වැරදි හැසිරීම්, නොගැලපෙන ඇඳුම්පැළඳුම්, විලාසිතා හේතුවෙන් ඔබ අවට ජීවත්වෙන පින්වතුන් ගොඩක් අකුසල් සිද්ධකොට ගන්නවා. එම නිසා පින්වත් දරුවන්, සමාජය ඉදිරියේදී වචනයක් කතාකරනකොට, පොදු ස්ථානයක හැසිරෙන කොට, ඇඳුම්පැළඳුම් තෝරාගන්න කොට, දෙවරක් සිතා බලන්න ඕනේ, මගේ මේ හැසිරීම නිසා, මා දෙස බලන අනුන් තුළ, කේන්තියක්, විසිරුණු සිතක් ඇති වේවි නේද කියලා. මෛත්‍රී සිත ප්‍රගුණ කරන දරුවා කවදාවත්, තමන්ගේ හැසිරීම් හේතුවෙන්, අනුන් තුළ විවේචනයක් ඇතිවෙන්න දෙන්නේ නැහැ. අනුන් සතුටුවෙන ආකාරයට, යහපත් සමාජ සම්මතට අනුව හැසිරෙනවා. එවිට එම දරුවා හැමෝටම ප්‍රිය දරුවෙක් වෙනවා. එම දරුවා මුළු සමාජයට ම මෙත් සිත පතුරුවන දරුවෙක් වෙනවා.

බුදුරජාණන් වහන්සේගේ උපසම්පදා භික්ෂූන් වන අපට, මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම සමාජ ඉදිරියේ ප්‍රිය උපදවන භික්ෂු ප්‍රතිරූපයක් ඇතිකොට විනය කාරණා 227ක් පනවා තිබෙන්නේ අපි නිසා අනුන් තුළත්, දෙන්න අනුන් නිසා අපි තුළත් මෙත් සිත ශක්තිමත් කොට දෙන්න. වචනය සංවර නැති, ක්‍රියාවන් සංවර නැති සමහර දරුවන්ගේ හැසිරීම් දැකලා, මඟතොටේදී වැඩිහිටියන් සිතින් ගැටිලා කේන්ති අරගෙන, හරියට අකුසල් සිදුකොට ගන්නවා. මෙවැනි දරුවන් තමනුත් හිංසනයට පත්වෙලා, අනුන්වත් හිංසනයට පත්කරන ඇවිදින අකුසල් නිධි බවටයි පත්වෙන්නේ.

අවුරුදු හතේ වයසේදී උතුම් සෝවාන් ඵලයට පත් වූ විශාකා දියණිය, ළමා වයසේදී ම, තමන්ව විවේචනය කළ බමුණන් දෙදෙනෙකුට ලස්සන සිංහනාදයක් කරනවා. මහා වැස්සක් වහින අවස්ථාවක, වැස්සට නොතෙමී ඉන්න තැනක් නොතිබුණ නිසා, දහහතර හැවිරිදි විශාකා දියණිය, වැස්සේ තෙමිතෙමී බොහොම සන්සුන් ගමනින්, බමුණන් දෙදෙනා වාඩි වී සිටි අම්බලමට ගොඩවුණා. එවිට බමුණන් දෙදෙනා කථා වෙනවා, මේ කෙල්ල හරිම කම්මැලි කෙල්ලක්. මෙච්චර වහිනකොටත්, තෙමිතෙමී කම්මැලිකමට එනවා. වැස්සකටවත් දුවාගන්න බැරි, කම්මැලිකමට ගැහැනු දරුවෝ හදන දෙමාපියන්ටයි බනින්න ඕනේ කියලා. බමුණන් දෙදෙනා තමන්ට කෙල්ල කියමින් බනින වචන, දහහතර හැවිරිදි විශාකා දියණියට හොඳින් ඇසුණා. විශාකා දියණිය බොහොම සන්සුන්ව, එම බමුණන් දෙදෙනාට පිළිතුරු දෙනවා. "මාමේ, ගැහැනු දරුවෙක් වචනයෙන් සංවර වෙන්න ඕනේ, ක්‍රියාවෙන් සංවර වෙන්න ඕනේ, ඇඳුමෙන් පැළඳුමෙන් සංවර වෙන්න ඕනේ. මාමේ, මේ වගේ වැසි දහයක් පැමිණියත්, මාගේ මේ සංවරබව බිඳින්න බැහැය කියලා, තමන්ට කෙල්ල කියමින්, දෝෂාරෝපණය කළ බමුණන් දෙදෙනාට, මාමේ කියමින් විශාකා දියණිය කළ සිංහනාදය, වර්තමානයේ පාසල් දරුවන්ට රත්තරංවලට වඩා වටිනා ආදර්ශයක් වෙනවා. නමුත් මොකක්දෝ අහේතුවකට, වර්තමානයේ රත්තරං මිල ඉහළ ගියත්, මෙවැනි වටිනා ගුණධර්මයන්ගේ මිල දිනෙන්දින ම අවරට යනවා. පින්වත් දරුවන් දක්‍ෂ නම් බාහිර සමාජය ඉදිරියේ ඔබේ වචන, ක්‍රියාවන්, ඇඳුම්පැළඳුම් සංවර කරගන්න. ඒ උතුම් සංවරභාවය තුළ ඔබව දකින මුළු සමාජයට ම, ඔබ මෙත් සිත පැතිරුවා වෙනවා. එම පින්වත් දරුවා දකින කාගේවත් සිත විසිරුණු සිතක් බවට, කේන්තිගන්න සිතක් බවට පත්කරන්නේ නැහැ. තමනුත් මෙත් සිත ප්‍රගුණ කරමින්, අන්‍යයන් තුළත් මෙත් සිතක් ම ඇතිකොට දෙන්න උපකාරවෙන දරුවෙක් වෙනවා.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවෙක් පන්ති කාමරයේදී, ශිෂ්‍යයින්ට මෙත් සිත පැතිරවිය යුත්තේ කෙසේද?

පාසල් දරුවන් පන්ති කාමරයේදී, යහළුයෙහෙළියන්ට, ගෙදරදී සහෝදර සහෝදරියන්ට මෙත් සිත පතුරුවන්න ඕනේ. තරගකාරී අධ්‍යාපන රටාවකට යොමු වී සිටින වර්තමාන දරු පරම්පරාව, හැකියාව සහ නොහැකියාව කියන කාරණා දෙක මත ද්වේශය, ඊර්ෂ්‍යාව සකස්කොට ගැනීමට පෙළඹෙන්න පුළුවන්. පන්ති කාමරයේදී තමන්ට වඩා හැකියාවන් ඉදිරිපත් කිරීමට දක්ෂ, ඔබේ පන්තියේ දරුවන්ට මෙත් සිත පතුරවන්න දක්ෂවෙන්න. අනුනගේ දක්ෂභාවයන්ට ඊර්ෂ්‍යා කරන දරුවා, තමන් සතු දක්ෂභාවයන් දුර්වලකොට ගැනීම ධර්මතාවයක් වෙනවා. ඔබට වඩා දක්ෂ දරුවෙක් දකිනකොට, සුවපත් වේවා කියලා මෙත් සිතක් ඇතිකොට ගන්න. එම මෙත් සිත ඔබව දක්ෂයෙක් බවට ඔසවා තැබීමට, හොඳ ම මඟපෙන්වන්නෙක් වෙනවා.

අනුන්ගේ දක්ෂභාවයට ගැටෙන්නටත්, අනුන්ගේ අදක්ෂභාවයට විහිළු කරන්නවත් එපා. දක්ෂයාටත්, අදක්ෂයාටත් දෙදෙනාට ම, මෙත් සිත පතුරුවන්න දරුවන් දක්ෂවෙන්න. මෙය සටහන් තබන භික්ෂුව, පාසල් ජීවිතයේදී ඉදිරිපත්වීම සහ ඉදිරිපත් කිරීම කියන කාරණා අතින් දුර්වල ශිෂ්‍යයෙක්. මාසයකට වතාවක් පන්තියේ පවත්වන සාහිත්‍ය රැස්වීමේදී, සිංදුවක් කියන්න මගේ නම යොදා තිබුණොත්, මම සාහිත්‍ය සංගමයේ සභාපති ශිෂ්‍යයාට බැගෑපත්වෙලා, මගේ නම ඉවත්කොට ගන්නවා. පන්තිය ඉදිරියට ගිහින් සිංදුවක් කියන්න මම එදා ලැජ්ජයි. පාසල් ජීවිතය තුළදී, ශිෂ්‍යයෙක් වශයෙන් මා තුළ තිබූ, ඉදිරිපත් වීමේ දුර්වලතාවයන් මගහරවා තරුණයෙක් වශයෙන් මාව සමාජගත කළේ, මට වයස විසිවැනි වියේදී, මුණගැසුණ කිංස්ලි වික්‍රමරත්න මහත්මයා මා තුළ සැඟවී තිබූ ලොකු පෞරුෂත්වයක් මතුකොට ගැනීමට, කිංස්ලි වික්‍රමරත්න මහත්මයා, මට ගොඩක් උපකාරක ධර්මයන් සකස්කොට දුන්නා. ඒ මහත්මයා මේ මොහොතේ ජීවතුන් අතර නැහැ. මේ උතුම් ධර්ම දානමය පින, එතුමාගේ පරලොව ජීවිතයේ සැපය, ධර්මාවබෝධය පිණිස ම හේතුවේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

පන්ති කාමරයේදී ඉදිරිපත්වීම අතින් මම දුර්වල ශිෂ්‍යයෙක් වූවත්, පන්තියේ සිටි දක්ෂ ශිෂ්‍යයන් දැකලා, මට කවදාවත් ඊර්ෂ්‍යාවක් ඇතිවෙලා නැහැ. නමුත් මටත් එවැනි දක්ෂයෙක් වෙන්න ඇතිනම් කියලා කැමැත්තක් ඇතිවුණා. අනුන්ගේ දක්ෂභාවයන් දැකලා ඊර්ෂ්‍යාවක් ඇති නොකරගත් නිසාමයි, මට දක්ෂයෙක් වෙන්න ලැබුණා නම් ලැබුණේ. මම හැමදාමත් දෙවැනියෙක් වෙන්න කැමති වුණා. මම දෙවැනියෙක් වෙලාමයි, පළමුවෙනියෙක් වුණේ. අතීතයේ මම දෙවැනියෙක් වෙන්න අකමැති වුණා නම්, මට කවදාවත් ගුණාත්මක පළමුවැන්නෙක් වෙන්න ලැබෙන්නේ නැහැ. වර්තමානයේ වුවත් භික්‍ෂුවට තේරුණොත්, යම් පින්වතෙක් භික්‍ෂුව සමග තරගයකට පැමිණෙනවාය කියලා, මම වහවහා ඔහුව මඟහැරයනවා. මගේ අතේ දැවටී තිබෙන කඹය, යම් පින්වතෙක් අදින බව තේරුණොත්, වහාම කඹය අතහරිනවා. මොකද, භික්ෂුව දෙවැන්නෙක් වෙන්න වර්තමානයෙත් කැමතියි. පින්වත් දරුවන් ද, ලෝභ, ද්වේශ ධර්මයන් ජීවිතයට එකතුකොට ගනිමින් පළමුවැන්නෙක් වෙන්න උත්සාහ ගන්න එපා. ලෝභ, ද්වේශ ධර්මයන් වඩමින් පළමුවැනියෙක් වෙන්න උත්සාහ ගන්න පින්වතා, අනිවාර්යයෙන් ම පළමුවෙනියෙක් වෙන්න පුළුවන්. නමුත් ඔහු කවදාවත් ම ගුණාත්මක පළමුවැන්නෙක් වෙන්නේ නැහැ. දෙවැනියෙක් වීමට, ඔබ ඇතිකොටගන්නා කැමැත්ත තුළ, උපේක්ෂාව කියන උතුම් ධර්මය, ඔබේ ජීවිතයට එකතුවෙනවා. උපේක්ෂාව කියන්නේ, උතුම් සප්ත බොජ්ඣංග ධර්මයන්ගෙන් එක උතුම් ධර්මයක්. දරුවෙක් වුවද උපේක්ෂාව තම ජීවිතයට එකතු වෙන්නේ සති, ධම්මවිජය, වීර්යය, ප්‍රීති, පස්සද්ධි, සමාධි කියන ධර්මතාවයන් හයක ඵලයන් වශයෙන්. උපේක්ෂාව ජීවිතයට එකතුකොටගත් දරුවා තුළ, කාමච්ඡන්ද, ථීනමිද්ධ, විසිරුණු සිත, සැකය, කේන්තිය කියන පංචනීවරණ ධර්මයන් තුනී වෙනවා. එම නිසා, පින්වත් මෙත් සිත ප්‍රගුණ කරන දරුවන් දක්ෂ වෙන්න ලෝභ, ද්වේශ ධර්මයන් වඩමින් පළමුවැනියෙක් වෙන්න යන ගමන මොහොතක් නවත්වලා, ගුණාත්මක පළමුවැන්නෙක් වීමට කැමැත්ත ඇතිකොට ගන්න.

සමහර පින්වත් දරුවන් සිටිනවා, තමන් දන්න පාඩමක් පන්තියේ යාළුවෙකුට කියලා දෙන්න කැමති නැහැ. අතපසු වූ සටහනක්

යාළුවෙක් ඉල්ලනකොට මගහරිනවා, පාඩම් කරන දරුවන්ට බාධාවන් සිදුකරනවා. මේ පුංචි සිත් තුළ ලෝභයත්, ද්වේශයත් හොඳහැටි පදමට මුසුවෙලයි තිබෙන්නේ. එම නිසා පින්වත් දරුවන් හැමෝම, තමන්ට හැකි අයුරින් සතුටු කරමින්, හැමෝගේ ම දක්‍ෂභාවයන්ට, අදක්‍ෂභාවයන්ට මෙත් සිත පතුරවමින් ගුණාත්මක පළමුවැනියෙක් වීමට දක්ෂ වෙන්න.

වර්තමාන සමාජයේ කුමන ක්ෂේත්‍රයක වුව ද යම් බිඳවැටීමක් තිබෙනවා නම්, එම බිඳ වැටීමට එක මූලික හේතුවක් වෙන්නේ, එම ක්ෂේත්‍රයේ පළමුවැනියා, ගුණාත්මක පළමුවැනියෙක් නොවීමයි. ඔහු ගුණාත්මක පළමුවැනියෙක් නොවන්නේ, අතීතයේ ඔහු දෙවැනියෙක් වීමට අකමැතිභාවයෙන් ලෝභ, ද්වේශ ධර්මයන් ප්‍රගුණ කරමින් පළමුවැනියෙක් වීමට උත්සාහ කිරීමේ ප්‍රතිඵලයයි. පින්වත් ඔබ දෙවැනියෙක් වීමට බියවෙන්න එපා, දෙවැනියෙක් වීමට ඔබ තුළ ඇතිවෙන කැමැත්ත තුළ, සැපයට අදාළ උතුම් ධර්මයක් වන, උපේක්ෂාව ඔබතුළ වැඩෙනවා. ඒ උතුම් ධර්මය, මේ ජීවිතයේදී ඔබව, ගුණාත්මක පළමුවැනියෙක් කරනවා වගේම, මරණයෙන් පසුව ඔබව, පටිච්චසමුප්පන්නව සශ්‍රීක දිව්‍යතලයක, පළමුවැනි දෙවියෙක්, දිව්‍යාංග නාවක් බවට පත්කරනවාමයි.

පාසල් දරුවෙක් අනාගතයේ, ගුණාත්මක පළමුවැනියෙක් වීම සඳහා, වර්තමානයේ දෙවැනියෙක් වෙන්න කැමතිවෙන්න කියන කාරණය කියවලා, පින්වත් දෙමාපියන්, ගුරු මහත්ම මහත්මීන් භික්ෂුව සමග ගැටෙන සිතක් ඇතිකොට ගන්න එපා. වර්තමාන තරගකාරී අධ්‍යාපන රටාවේදී, ඉහත අර්ථය නිෂේධ වෙලයි තිබෙන්නේ. වර්තමාන අධ්‍යාපන රටාව යොමුවෙලා තිබෙන්නේ, මෙලොව වශයෙන් ගුණාත්මක නොවන පළමුවැන්නෙක් වීමත්, පරලොව වශයෙන් සතර අපායට ගාල්වීමත් කියන අර්ථයමයි. නමුත් භික්ෂුව, ධර්මයේ සැපයන්ට අදාළවයි සටහන් තබන්නේ. භික්‍ෂුව ලෝකයට දෙන්නේ, සප්ත බොජ්ඣංගයන් වැඩෙන සතුටක්, මාර්ගයක් පමණක්මයි. පංචනීවරණ වැඩෙන, නොවටින සතුටක් පින්වත් ඔබට දෙන්නේ නැහැ. ඉහත සටහනේ යම් වරදක් පින්වත් ඔබ දකිනවා නම් භික්ෂුව නිහතමානීව එම පින්වතුන්ගෙන් සමාව අයදිනවා.

අතීතයේ චුල්ලපන්තක පුංචි ආයුෂ්මතුන්ට ගාථා පද හතරක් පාඩම් කරගන්න මාසයක කාලයක් ගතවෙලත් පුළුවන්කමක් තිබුණේ නැහැ. නමුත් බුදුරජාණන් වහන්සේ දකිනවා, චුල්ලපන්තක ආයුෂ්මතුන් දැනුමෙන් දුර්වල වුවද, අවබෝධයෙන් උතුම් රහතන් වහන්සේ නමක් වෙන්න ශක්තිය තිබෙනවාය කියලා. නුගත් චුල්ලපන්තක ආයුෂ්මතුන් තුළින්, අවබෝධයෙන් අතිශ්‍රේෂ්ඨ මහරහතුන් වහන්සේ නමක් මතුකොට ගැනීමට බුදුරජාණන් වහන්සේ උපකාරක ධර්මයක් සකස්කොට දෙනවා. චුල්ලපන්තක පුංචි ආයුෂ්මතුන්ගේ, නායක ස්වාමීන් වහන්සේ පුංචි චුල්ලපන්තක ආයුෂ්මතුන්ට මෝඩයා කියලා දෝෂාරෝපණය කරලා, සිවුරු හැරයන්න කියලා යෝජනා කොට තිබියදීත්, බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය, චුල්ලපන්තක පුංචි ආයුෂ්මතුන්ගේ මෝහය, මෝඩකම අනුශය වශයෙන් හෝ නොතබාම, නිෂේධකොට දැමීමට උපකාර වෙනවා.

වර්තමානයේ පන්ති කාමරයේ දරුවන් අතර අධ්‍යාපනයෙන් දුර්වල දරුවන් සිටින්න පුළුවන්. මෙවැනි දරුවන්ට මෝඩයා වැනි වචන කියලා විහිළු කරන්න එපා. මෙත් සිත ප්‍රගුණ කරන දරුවා, දුර්වල දරුවාත් සුවපත් වේවා කියලමයි සිතන්න ඕනේ.

යම් කායික ස්වභාවයක් නිසා, තවත් දරුවෙකුට ඔබ විහිළු කරන්න එපා. මොකද ඔබ විහිළුවට ලක්කරන, දුර්වල දරුවා තුළ උතුම් රහත්ඵලයට පත්වීමට අවශ්‍ය පින සැඟවී තිබෙන්න පුළුවන්. සමහර පින්වත් දරුවන්ගේ පුරුද්දක් තමයි, තමන්ගේ පන්තියේ යාළුවන්ට, කුමක් හෝ නමක් පටබඳිනවා, එම නමෙන් විහිළු කරනවා. මෙවැනි ක්‍රියාවන් නිසා අහිංසක දරුවන් මානසික හිංසනයට ලක්වෙනවා.

මෙය සටහන් තබන භික්ෂුව, පාසල් කාලයේදී පන්තියේ අනෙක් දරුවන්ට වඩා මහතින් වැඩියි. එම නිසා, පන්තියේ සමහර දරුවන් බතලයා, තාත්තා කියලා විහිළු කරනවා. මට මතකයි මම අ.පො.ස (සා.පෙ.)ට උපකාරක පන්තිවලට ගිය වෙලාවේ, පන්තියේ සිටින ගැහැනු දරුවන් මට, තාත්තේ කියලා විහිළු කරනවා. මෙවැනි විහිළු නිසා, ළමා මා තුළ ඇති වූ මානසික පීඩාවන් හේතුවෙන්, උපකාරක පන්තිවලට නොගිහින් සිටීමට මට සිතුණ වාර හුගක් තිබුණා.

දරුවෙක්ගේ ශාරීරික හැඩරුවේ, යම් විවිධත්වයක් සකස් වෙන්නේ අතීත සංස්කාරයන්ගේ හේතුවෙන්. නමුත් පින්වත් දරුවන්, අනුනට මෙත් සිත පැතිරවීමට ඇති අදක්ෂභාවය නිසා ම, අතීත සංස්කාර ධර්මයන්ට බතලයා, තාත්තා කියලා විහිළු කරමින්, සංස්කාර ධර්මයන් හාස්‍යයට ලක්කොට, අකුසල් සිද්ධකොට ගන්නවා. පින්වත් මෙත් සිත ප්‍රගුණ කරන දරුවන්, මොන ම හේතුවක් නිසාවත් තම පාසලේ දරුවන්ට, තමන් නීත්‍යානුකූලව යොදා ඇති නමෙන් හැර, වෙනත් පටබඳින නම්වලින් විහිළු කරන්න එපා. පින්වත් දරුවන්ට මේවා විහිළු වුණාට, මෙවැනි මානසික හිංසනයන්, ඔබලාට බලවත් අකුසල් උපද්දවා දෙනවා. පින්වත් දරුවන් දැකලා තිබෙනවානේ, සමාජයේ ජීවමාන සමහර දරුවන්ගේ රූපයේ, විකෘතිභාවයන් තිබෙනවා, අවලස්සන ස්වභාවයන් තිබෙනවා, අධ්‍යාපනයෙන් දුර්වල ස්වභාවයන් තිබෙනවා. ඇයි මෙවැනි තමන් අකමැති දේවල්, තමන්ට සිද්ධවෙලා තිබෙන්නේ? අතීත භවයන්හිදී අනුනගේ ශාරීරික දුර්වලතාවයන් දැකලා, මානසිකව හිංසා කිරීමේ අරමුණින්, විහිළුතහළු කරලා, ඒවායේ විපාකයන් හැටියටයි, වර්තමානයේ අපිත් අනුන්ගේ විහිළුතහළුවලට ලක්වෙන්නේ. සමහරක් පින්වත් දරුවන් තමන්ගේ පාසල් ගුරු මහත්ම, මහත්මීන්ටත් පටබඳින ලද නම්වලින් හඳුන්වන අවස්ථාවන් තිබෙනවා. දරුවන් තම දැස් පාදන පින්වත් ගුරුවරයාට, දේවත්වයෙන් සැලකිය යුතුව තිබියදී, යම් දරුවෙක් තම පින්වත් ගුරුවරයාව මානසික හිංසනයට ලක්කිරීමෙන්, දරුවන්ගේ මෙලොව ජීවිතය අසාර්ථක වෙනවා වගේම, පරලොව ජීවිතයේදී, අන්ත නූගත් දරුවන් වීමේ අවධානම තම ජීවිතවලට එකතුකොට ගන්නවා.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවන්, පරිසරයට මෙත් සිත පතුරවන්නේ කෙසේද?

වර්තමාන සමාජයේ ජීවත්වෙන මාමලා නැන්දලාගේ තෘෂ්ණාවේ වැඩි භාවය නිසා, පමණ නොදන කරන පරිභෝජන රටාව නිසා, පරිසරයට හුඟක් අපද්‍රව්‍ය මුදාහරිනවා. එම නිසා දිනෙන්දිනම පරිසරයේ විෂබීජ ස්වභාවයන් වැඩිවෙනවා. එම නිසා පින්වත් දරුවන්, ළමා වයසේ සිට ම පරිසරයට මෙත් සිත පතුරවන්න පුරුදු වෙන්න ඕනේ.

දරුවෙක්, තමා අවට පරිසරය කියලා කියන කොට, මුලින් ම දරුවා තමන්ගේ ඇස අවට පරිසරය පිරිසිදුව තබාගන්න දක්ෂ වෙන්න ඕනේ. කණ, නාසය, මුඛය අවට පරිසරය පිරිසිදුව තබාගන්න දක්ෂ වෙන්න ඕනේ. සමහර දරුවන් දත් මදින්න හරි ම කම්මැලියි. උදේට, රාත්‍රියට පුරුද්දක් වශයෙන් දත් මදින්නේ නැහැ. එම නිසා, එවැනි දරුවන්ගේ මුඛය අවට පරිසරය හරි ම අපිරිසිදුයි. සමහර දරුවන් උදේට මුහුණ සෝදන්න හරි ම කම්මැලියි. එම නිසා ඇස අවට පරිසරය අපිරිසිදුවයි පවතින්නේ. සමහර දරුවන් නාන්න, ඇඟ සෝදන්න කම්මැලියි. එවැනි දරුවන්ගේ, හිසකෙස් ආශ්‍රිත පරිසරය අපිරිසිදුවයි පවතින්නේ. දරුවන්ට සමීප ම පරිසරය වන, ශරීරය පිරිසිදුව තබා ගැනීමෙන්, ඔබ මුලින් ම අවට පරිසරයට මෙත් සිත පැතුරුවා වෙනවා. දරුවන් ප්‍රසන්නව, ලස්සනට, පිරිසිදුව ඉන්නවා දැකලා, හැමෝම සතුටු වෙනවා. එවිට පින්වත් දරුවන්, ඔබේ ශරීරයේ පිරිසිදුභාවය තුළින්, බාහිර සැමට ම මෙත් සිත පැතිරුවා වෙනවා.

දෙවනුව පින්වත් දරුවන්, මනස අවට පරිසරය පිරිසිදුව තබාගත යුතුයි. සමහර දරුවන් ඇසෙන් රූප දැකලා, කණෙන් ශබ්ද අසලා, මනස අවට පරිසරය අපවිත්‍රකොට ගන්නවා. කේන්තිගැනීම නිසා, කම්මැලිකම නිසා, අහංකාරකම නිසා මනස අවට පරිසරය අපිරිසිදු කොට ගන්නවා. මනස අවට පරිසරය අපවිත්‍ර වෙන කොට, මනස නිසා සකස්වෙන සිතුවිලි අපවිත්‍ර වෙනවා, කිළිටි වෙනවා. ළමා මනස නොකිළිටිභාවයෙන් තබාගන්න පුළුවන් හොඳ ම ප්‍රතිකාරය තමයි, මෙත් සිත පුහුණු කිරීම. දරුවන් තමන් කැමති දෙයක් දකින කොටත්, සුවපත් වේවා කියලා සිතනවා. අකමැති දෙයක් දකිනකොටත් සුවපත් වේවා කියලා ම සිතනවා. පින්වත් දරුවන් තුළ සකස්වෙන කැමැත්තත්, අකමැත්තත් දෙක ම සුවපත්වෙනකොට, මුලින් ම සුවපත් වෙන්නේ, තමාමයි. අනුන්ට සුවපත් වේවා කියලා අර්ථවත්ව සිතනකොට, තමන් සුවපත්වෙන, ලෝකයේ ඇති එක ම ආශ්චර්යවත් ධර්මය මෛත්‍රියයි. මේ ශ්‍රේෂ්ඨ ධර්මය පින්වත් දරුවන් තුළින් මතුකොටගත හැක්කේ, මනස අවට පරිසරය ලෝභ, ද්වේශයන්ගෙන්, පිරිසිදුකොට ගත්තොත් පමණක්මයි.

පින්වත් දරුවන් තමන්ගේ පන්ති කාමරය, තමන්ගේ නිදන කාමරය, පොත් රාක්කය, පොත් බෑගය, පතපොත පිළිවෙළකට, පිරිසිදුව තබා ගැනීම නිසා මෙම පිරිසිදුභාවය දකලා හැමෝම සතුටු වෙනවා. හැමෝගේ ම ආදරය ඔබට ලැබෙනවා. පින්වත් දරුවන් සියලු සත්වයෝ සුවපත් වේවා කියලා, වචනයෙන් පමණක් කීවාට ඵලයක් නැහැ. ඔබව දකින සියලු ම සත්වයින් තුළ, ඔබ නිසා සතුටක්, ප්‍රසාදයක් ඇතිවෙන ආකාරයට ඔබ ක්‍රියාත්මක වෙන්න ඕනේ.

පාසල් දරුවන් අවට පරිසරයට මෙත් සිත පතුරුවනවාය කියන කාරණයේදී, දරුවන් තම නිවස, පාසල අවට පරිසරය කෙරෙහි සැලකිලිමත් වෙන්න ඕනේ. පරිසරය අපවිත්‍ර කිරීම නිසා පැතිරයන භයානක මාරාන්තික ඩෙංගු උණ වැනි ලෙඩරෝග තිබෙනවා. පින්වත් දරුවන් පරිසරය විනාශ කරනවාය, අවලස්සන කරනවාය කියන කාරණය, හරි ම අනතුරුදායක දෙයක් වෙනවා.

පින්වත් දරුවන් සිතන්නකෝ, ඔබේ නිවසේ ලස්සන සුවඳ හමන මලින් පිරුණු මල් ගසක් තිබෙනවාය කියලා. පින්වත් දරුවන්, එම මල් ගහේ කොළ සහ මල් පමණයි දකින්නේ. පින්වත් දරුවන් නොදකින නමුත්, බුදුරජාණන් වහන්සේ දකලා දේශනා කළ, තවත් දෙයක් එම මල් ගහේ තිබෙනවා. එම ලස්සන සුවඳවත් මල් ගහේ සුවඳට, පැහැයට, මල්වලට තෘෂ්ණාවෙන් බැඳුණ රුක් දෙවියන්, රුක් දිව්‍යාංගනාවන් එම සුවඳ මල් ගස මගේ කොටගෙන ජීවත් වෙනවා. පින්වත් දරුවන් එම මල්ගසෙන් බුදුරජාණන් වහන්සේට පූජා කරන්න මල්, වට්ටියකට කඩනකොට, එම රුක් දෙවියන් දිව්‍යාංගනාවන් සතුටු වෙනවා. මගේ මල් ගසෙන් පින්වත් දරුවෙක්, බුදුරජාණන් වහන්සේට පූජා කරන්න මල් නෙළනවායි කියලා එම දරුවාට ආශිර්වාද කරනවා. එම රුක් දෙවියන් සතුටට පත්වෙනවා. නමුත් යම් දරුවෙක් එම ලස්සන මල් ගහේ මල් කඩලා පොඩි කරලා, එම ලස්සන මල් ගසේ අතු කඩලා දම්මොත්, එම ලස්සන මල් ගස අවට පරිසරයට කුණුකසළ දම්මොත් එම රුක් දෙවියන් දරුවන් කෙරෙහි කේන්තිගන්නවා. එවැනි දරුවන් සමග ද්වේශය ඇතිකොට ගන්නවා. පින්වත් දරුවන් එම ලස්සන මල් ගසට වතුර බාල්දියක් දමනකොට, ගොම පොහොර ටිකක්

දමන කොට එම මල් ගසේ සිටින රුක් දෙවියන් සතුටු වෙනවා, මල් ගසට වතුර දමන, දරුවාට ආශිර්වාද කරනවා. නමුත් යම් දරුවෙක් එම ලස්සන මල් ගස මුලට මුත්‍රා කරනවා නම් එම රුක් දෙවිවරු එම දරුවා කෙරෙහි ද්වේශ ඇතිකොට ගන්නවා. පින්වත් දරුවන් සිතන්න, අඹ ඵලවලින් පිරිච්ච අඹ ගසක් තිබෙනවායි කියලා. එම අඹ ගසේ ගෙඩිවලට, සුවඳට, පැහැයට, තෘෂ්ණාවෙන් අඹ ගස මගේ කොටගෙන ජීවත්වෙන, රුක් දෙවියන් සිටිනවා. පින්වත් දරුවන් එම අඹ ගසේ ගෙඩි හොඳින් ඉදුණහම, එම ඉදුණ අඹ ගෙඩි කඩාගන්න කොට, එම රුක් දෙවියන් සතුටු වෙනවා, අඹ ගසට, රුක් දෙවියන්ට හානියක් නොකර, මේ හොඳ දරුවා අඹ කඩාගන්නවාය කියලා.

නමුත් යම් දරුවෙක්, අඹ ගසේ ගෙඩි පැසෙන්නටවත් ඉදෙන්නටවත් පෙර, අඹ ගැට කාලයේදී ම, අඹ ගසට පොලුවලින් ගහලා අඹ ගැට කඩනවා නම්, එම අඹ ගසේ සිටින රුක් දෙවියන්ට, අඹ ගසෙන් බලාපොරොත්තු වන සුවඳ, වර්ණය, පැසුණු අඹවල මිහිර අහිමිකොට දැමීම නිසා, නොපැසුණු අඹ පොලුගසා කඩන දරුවන් කෙරෙහි, එම රුක් දෙවියෝ ද්වේශ ඇතිකොට ගන්නවා.

පින්වත් දරුවන් සිතන්නකෝ, ඔබේ පාසලේ හොඳින් අතු විහිදුණ ගසක් තිබෙනවායි කියලා. එම ගසට අධිගෘහිත දෙවියන් ගසේ විමානය හදාගෙන ජීවත් වෙනවා. පින්වත් දරුවන් එම ගසේ මුල සෙවණට වාඩිවෙලා, යහපත් වචන කථා කරන කොට, එම රුක් දෙවියන් සතුටු වෙනවා. මේ හොඳ දරුවන් මගේ ගසේ සෙවණ යට වාඩිවෙලා යහපත් වචන කථාකරනවාය කියලා. යම් දරුවෙක් එම ගසට නැගලා ගසේ අතු කැඩුවොත්, එම පිරිසිදු ගස මුලට කුණු පාර්සලයක් ගෙනත් දැම්මොත් රුක් දෙවියන් එම දරුවන් කෙරෙහි ද්වේශයක්, පළිගැනීමේ චේතනාවක් ඇතිකොට ගන්නවා. පාසල් ආශ්‍රිත ගස්වල දරුවන් උපාදානය කොටගත්, දරුවන්ට ප්‍රිය, පාසල උපාදානය කොටගත්, දෙවියන්, දිව්‍යාංගනාවන් විමාන හදාගෙන ජීවත් වෙනවා. අතීතයේ ඔබේ ම පාසලේ අකුරු කියලා දුන්න ගුරුතුමන්ලාද, මරණින් පසුව මෙවැනි රුක් දෙවියන්ව සිටින්නට පුළුවන්. එම දෙවිවරු කැමතියි, නිතර ම දරුවන්ගේ යහපත් හැසිරීම් දකින්න, සෙල්ලම් දකින්න.

යම් දරුවෙක් පාසල් පරිසරයේදී, නරක විදියට, අකීකරු විදියට පරිසරය අපිරිසිදුවෙන විදියට, හැසිරෙන කොට එම දෙවිවරු, අකීකරු දරුවන් කෙරෙහි ද්වේශය, පළිගැනීම ඇතිකොට ගන්නවා. නමුත් පින්වත් දරුවන් මේ බව දන්නේ නැහැ. පින්වත් දරුවන්, ගස්වල දෙවියන් වැඩසිටිනවාය කියන කාරණයවත් දන්නේ නැහැ. නමුත් මෙතන තිබෙන භයානක ම කාරණය තමයි, පරිසරය අපිරිසිදු කරන, ගස්කොළන් අවිචාරවත් ලෙස විනාශ කරන, දරුවන් කෙරෙහි ද්වේශය, පළිගැනීම ඇතිකොටගන්නා රුක් දෙවියන්, අමනුෂ්‍යයින්, එම ද්වේශය උපාදානය කොටගෙන මියගොස්, ඩෙංගු මදුරුවෙක්, බරවා මදුරුවෙක්, පිස්සු බල්ලෙක් වෙලා උපදිනවා, සර්පයෙක් වෙලා උපදිනවා, එසේත් නැතිනම් රියදුරු මාමලාගේ ශරීරයට වැහිලා මාරාවේශයන් ඇති කරනවා. මේ විදියට තමන්ට, පෙර ජීවිතයේදී හිංසා කරපු දරුවන්ගෙන් පළිගන්නවා. පිස්සු බල්ලෙක් සෑම දරුවෙකුවම සපා කන්නේ නැහැ. සමහර විට දරුවන් දහදෙනෙක් පසුකොටගෙන ගිහිල්ලා, එකොළොස්වැනි දරුවාමයි සපාකන්නේ. දරුවන් දාහක් සිටින තැන ඩෙංගු මදුරුවා දෂ්ඨ කරන්නේ එක දරුවෙකුටයි. මේ ධර්මතාවයම තමයි බුදුරජාණන් වහන්සේ '**සංස්කාර පච්චයා විඤ්ඤාණ**' කියලා කියන්නේ. ඩෙංගු මදුරුවාට, පිස්සු බල්ලාට අහවල් දරුවා සපා කන්න ඕනෑය කියලා දැනීම සකස් වෙන්නේ පෙර ජීවිතයේදී ඇතිකොටගත් වියරු, පළිගැනීමේ චේතනාවන් නිසාමයි. එම නිසා පින්වත් දරුවන්, කුණුකසළ දමලා, ටොෆි දවටන, යෝගට් කෝප්ප දමලා, ගස්වැල්වලට හානිකරලා අනවශ්‍ය ආකාරයට පරිසරයට හානි කරන්න එපා. එවිට ඔබ පරිසරයට මෙත් සිත නොවැඩූ දරුවෙක් වෙනවා. ඔබ ඔබට වගේම, ඔබ අපවිත්‍ර කළ පරිසරය නිසා ගැටෙන, සිත විසිරෙන, මනුෂ්‍යයන්, දෙවියන්, අමනුෂ්‍යයින් හිංසාවට පත්කළ දරුවෙක් බවටයි පත්වෙන්නේ. වර්තමානයේ මහපාරේ ගමන් කරන කොට, වැඩිහිටි මාමලා නැන්දලා, ලස්සන ගස් යට කුණු පාර්සල් දමලා යනවා. ගස්වල කුණු පාර්සල් එල්ලලා තිබෙනවා. පරිසරයේ ලස්සන තැන් කුණු දමා අපවිත්‍රකොට තිබෙනවා. පාසල් දරුවෝ, මේ වැඩිහිටි මාමා නැන්දලාගේ නරක පුරුදු, දෙවියන්ගේ, මනුෂ්‍යයින්ගේ, අමනුෂ්‍යයන්ගේ සිතුවිලි විසිරෙන, ද්වේශය ඇතිවෙන,

නොසතුට ඇතිවෙන නරක පුරුදු එහෙම පුරුදු වෙන්න එපා. ලස්සන පරිසරයට කුණුකසළ දමන මාමලා නැන්දලා නොදන්න, ලස්සන පරිසරය අපවිත්‍ර කිරීම හේතුවෙන් ගැටෙන, ද්වේශය ඇති කොට ගන්න වියරු දෙවියන්, අමනුෂ්‍යයන් ගැන, ඒවායේ ආදීනවයන් ගැන දෙපාරක් සිතා, පරිසරය අපවිත්‍ර නොකර ඉන්න දක්ෂ වෙන්න ඕනේ. එය දරුවන්ටත් හොඳ ආදර්ශයක් වෙනවා.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවන් සියලු සත්වයින්ට මෙත් සිත පතුරවමින්, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය කුමක්ද?

යම් දරුවෙක් නිවසේදී, පාසලේදී, ක්‍රීඩා පිටියේදී බුදුරජාණන් වහන්සේට කීකරුභාවයෙන්, මෙත් සිත වර්ධනය කොට ගනිමින්, ජීවත් වෙනකොට අනිවාර්යයෙන් ම එම දරුවා තුළ ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙනවා. එවිට දරුවාගේ පින, දරුවාගේ කුසල් ශක්තිය වැඩෙනවා. එම දරුවා මනුෂ්‍යයින්ට, දෙවියන්ට, අමනුෂ්‍යයින්ට ප්‍රිය උපදවන දරුවෙක් වෙනවා, වසවිසෙන් ආරක්ෂා වෙනවා, ශරීරය ලස්සන වෙනවා, නපුරු සිහින පෙනෙන්නේ නැහැ, සුව සේ නින්ද යනවා, සුව සේ උදේ පාන්දර ම පිබිදෙනවා, සිහිමුලා නොවූ දරුවෙක් වෙනවා. බලන්න, පින්වත් දරුවන් මෙත් සිත වර්ධනය කරගන්න කොට, ජීවිතයේ දියුණුවට, සැපයට අදාළ කොච්චර දේවල් ජීවිතයට ලැබෙනවද කියලා. පින්වත් දරුවන් මෛත්‍රිය වැඩීමෙන් දෙවියන්, මනුෂ්‍යයන්, අමනුෂ්‍යයින්, ඔබට ප්‍රිය වෙනකොට, වියරු, නපුරු, මනුෂ්‍යයින්ට, දෙවියන්ට, අමනුෂ්‍යයන්ට ඔබට අනතුරු විපත් සිදුකරන්න තිබෙන ඉඩකඩ අවම වෙනවා.

අවංකව ම, මෙත් සිත වඩන දරුවාට, වසවිසෙන් හානි සිදු නොවෙනවාය කියන්නේ, එම දරුවාට ඩෙංගු මදුරුවන් දෂ්ඨ කළත්, එම විෂ, දරුවාගේ මෛත්‍රී ශක්තිය නිසා, රුධිර ධාතුව තුළ ඇතිවෙන, ප්‍රතිශක්තියෙන් දුර්වල වෙලා යනවා. මෛත්‍රී වැඩීම නිසා, ඔබේ ශරීරයේ ඇති වන ප්‍රසන්නභාවය හේතුවෙන් මදුරුවන්ට, ඔබව මඟහැරී යනවා. මෙත් සිත පුහුණු කරන දරුවා දෙමාපියන්ට අකීකරු

වෙලා, නුසුදුසු වසවිස, රසකාරක සහිත ආහාර, අතුරුපස අනුභව කරන්න යන්නේ නැහැ. දෙමාපියන් යමක් එපා කිව්වොත්, එම දරුවා එය කරන්නේ නැහැ. එය එම දරුවා තුළ වැඩෙන සම්මා සතියේ ලක්ෂණයක්. එම නිසා ම ළමා පරපුරට බරපතල හානි කරවූ, වර්තමාන ආහාරවලින් වසවිසෙන් වන හානිවලින් දරුවන් යම් පමණකට හෝ දුරස් වෙනවා.

මෙත් සිත ප්‍රගුණ කරන දරුවා නිරතුරුව ම ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරන නිසා, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, සීලයේ ආරක්ෂාවත් තුළින් වැඩෙන කුසල් ශක්තියෙන්, දරුවාගේ අතීත අකුසල් යටපත් වෙලා, කුසල් පක්ෂය මෝදුවෙලා, අධ්‍යාපන කටයුතුවලදී ශක්තිමත් දරුවෙක් බවට පත්කරනවා. ගුණාත්මක දරුවෙක් බවට පත්කරනවා, අනුනට අකුසල් රැස්කොට නොදෙන, තමනුත්, ආරක්ෂාවී, අනුනුත් ආරක්ෂාකොට දෙන, නොවිසිරුණු සිතක් සහිත දරුවෙක් වෙනවා. මේ කීකරු භාවය එම දරුවාගේ සම්මා සමාධිය වෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යම් දරුවෙක් මෙත් සිතින් තම දෙමාපියන්ට, වැඩිහිටියන්ට වන්දනා කරන කොට ආයුෂය, වර්ණය, සැපය, බලය කියන කාරණා හතරක් දරුවාගේ ජීවිතයට එකතු වෙනවාය කියලා. පින්වත් දරුවෙක් වැඩිහිටියන්ට වන්දනා කරනවා කියන්නේ, තමා තමාට වන්දනා කර ගැනීමක්. පින්වත් දරුවෙක් වැඩිහිටියන්ට වන්දනා කරන්න අකමැතිය කියන්නේ, උවමනාවෙන් ම එම දරුවා තම ජීවිතයට ආයුෂය, වර්ණය, සැපය, බලය අහිමි කොට ගන්නවා. වැඩිහිටියන්ට වන්දනා කිරීමෙන් දරුවන්ට ආයුෂය, වර්ණය, සැපය, බලය ලැබෙනකොට, දරුවන්ට අමුතුවෙන් මුහුණට පවුඩර් දමන්න අවශ්‍ය නැහැ. පවුඩර් නොදමා, ළමා මුහුණ ලස්සන කරන ධර්මතාවයන් වැඩිහිටි වන්දනාව තුළ තිබෙනවා. දරුවන් දෙමාපියන්ටත්, ගුරුවරුන්ටත්, වැඩිහිටියන්ටත්, වන්දනා කරන කොට, පසඟ පිහිටුවා වන්දනා කළ යුතු වෙනවා. ඒ කියන්නේ නළල, දෙදණ, දෙවැලමිට බිම ස්පර්ශ වන ආකාරයට, වැඩිහිටියන්ගේ දෙපා දෑතින් ස්පර්ශ වෙන ආකාරයට වන්දනා කරන්න ඕනේ. එවිට දරුවාගේ මෙත් සිත තවතව වර්ධනය වෙනවා. නමුත් පින්වත් දරුවන් ස්වාමීන්

වහන්සේලාට වන්දනා කරන කොට, ස්වාමීන් වහන්සේලාගේ දෙපා ස්පර්ශ කරන්න හොඳ නැහැ. එය නුසුදුසු ක්‍රියාවක් වෙනවා.

යම් දරුවෙක් දෙමාපියන්ට, ගුරුවරුන්ට, වැඩිහිටියන්ට අකීකරු වෙන මොහොතක් පාසා එම දරුවා මිච්ඡා ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළයි ගමන් කරන්නේ. දෙමාපියන්ට අකීකරු වෙන කොට තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් එම දරුවා බැහැර වෙනවා, බුදුරජාණන් වහන්සේට අකීකරු වෙනවා. එම දරුවා කේන්තිගන්න කොට සම්මා සංකප්පයෙන් බැහැරට යනවා. එවිට එම දරුවා තුළ අකුසලයට අදාළ පංචනීවරණ ධර්මයකුයි වැඩෙන්නේ. එය පින්වත් දරුවෙක් තමා තමාට සිදු කර ගන්නා බරපතල ම හිංසනය වෙනවා. පින්වත් දරුවන් තේරුම් ගන්න ඕනේ, ලෝකය නිවැරදි කරන්න අපිට බැහැ. එම නිසා මෙත් සිත පුහුණු කරමින් තනිතනිව ඔබ සමාජයට ආදර්ශවත් වෙන්න දක්ෂ වෙන්න. එවිට යම් පමණකට හෝ සමාජය නිවැරදි වේවි. ඔබ නිවැරදි වීම පසෙක තබලා, කේන්ති අරගෙන, අකීකරු වෙලා ලෝකය නිවැරදි කරන්න ඔබ ගියොත්, නිවැරදි කරන්න බැරි ලෝකය තුළ ඔබත් අනතුරට පත් වූ දරුවෙකු බවටයි පත්වෙන්නේ.

ස්වාමීන් වහන්ස, දෙමාපියන්ට කීකරුභාවය තුළින්, දරුවෙක් ආර්ය අෂ්ටාංගික මාර්ගය මතු කොට ගන්නේ කෙසේද?

පින්වත් දරුවන් සිතන්න, ඔබ උදේ ම නැගිටලා, අලස බවෙන් තොරව, මුහුණ සෝදලා, පාසල් යන්න සූදානම් වෙලා ඔබ දෙමාපියන්ට පසඟ පිහිටුවා වන්දනා කරනවා. පින්වත් දරුවන් අනුන්ගේ බලපෑමකින් තොරව, දෙමාපියන්ගේ සිත් නොරිදවා, පාසල් ගමනට පෙරාතුව දෙමාපියන්ට පසඟ පිහිටුවා වන්දනා කරනකොට ම, ඔබ සම්මා දිට්ඨියේ අර්ථයන් ජීවිතයට එකතු කොටගත් දරුවෙක් වෙනවා. ඔබ තෙරුවන් කෙරෙහි කීකරු දරුවෙක් වෙනවා, යහපත් දෙයක ඇති යහපත් විපාකයන් හඳුනන දරුවෙක් වෙනවා, දෙමාපියන්ගේ ගුණයන් ගැන විශ්වාසය සහිත දරුවෙක් වෙනවා. දෙමාපියන්ට වන්දනා කරන මොහොතේ එම දරුවා තුළ හිංසාවට, ව්‍යාපාදයට,

ද්වේශයට, මෝහයට අදාළ අකුසල මූලයන් සකස් වීමක් නැහැ. සම්මා සංකප්පයන් වැඩෙනවා. දෙමාපියන්ට වන්දනා කරන මොහොතේ, දරුවා තුළ සිල්පද දුර්වල වීමක් නැහැ. '**සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ**' ධර්මයන් දරුවා තුළ වැඩෙනවා." එම දරුවා, ජීවිතයට අලුත් කුසලයක් එකතුකොට ගන්නවා. එවිට සම්මා වායාමෝ ධර්මයත් වැඩෙනවා. අම්මාට තාත්තාට පසඟ පිහිටුවා වන්දනා කරන මොහොතේ එම දරුවා පින පව හඳුනනවා, කුසලය, අකුසලය හඳුනනවා. ධර්මය, අධර්මය හඳුනනවා. ඒ කියන්නේ, දරුවා තුළ සම්මා සතිය වැඩෙනවා. දරුවා දෙමාපියන්ට වන්දනා කරන මොහොතේ දරුවා තුළ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා ධර්මයන් යටපත් වෙලයි තිබෙන්නේ. දරුවා එම නිමේශයේදී සම්මා සමාධිය තුළයි පසුවෙන්නේ. දෙමාපියන්ට, ගුරුවරුන්ට කරන ගෞරවනීය වන්දනාවන් තුළදී එම සත්පුරුෂ දරුවා තුළ මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ම අර්ථය වැඩෙනවා.

යම් දරුවෙක් දිනය පුරාවට සමාජයට මෙත් සිත පතුරවමින්, තම අධ්‍යාපන කටයුතු සිදුකරනකොට එම දරුවා තුළ දිනය පුරාවට ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් වැඩෙනවා. පින්වත් දරුවන් නිසා ඔබේ දෙමාපියන්ගේ නෙතින් වැගිරෙන සෑම සතුටු කඳුළක ම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථය සැඟවිලා තිබෙනවා. ඒ වගේමයි පින්වත් දරුවෙක් නිසා, ඔබේ දෙමාපියන්ගේ නෙතින් වැගිරෙන සෑම දුක් කඳුළක ම අකුසලයට හේතුවෙන මිච්ඡා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථය සැඟවිලා තිබෙනවා.

මෙය සටහන් තබන භික්ෂුවට මතකයි, මගේ ගිහි කාලයේදී මගේ අම්මා, අංශභාගය රෝගය හේතුවෙන් රෝගාතුරව කාලය ගතකරන කොට, දිනක් අම්මාට දහවල් ආහාරය කවන්න නියමිත වේලාවට වඩා පැය තුනක පමණ කාලයක් අත්‍යවශ්‍ය හේතුවක් නිසා ප්‍රමාදයට පත්වුණා. මීට පෙර කවදාකවත්, එවැනි ප්‍රමාදයක් සිදුවෙලා නැති නිසා එදා රෝගාතුර අම්මා බය වෙලා හිටියේ, මට කුමක් වුණා ද කියලා දන්නේ නැති නිසා. ඒ වගේමයි, ටිකක් මා සමග අමනාප ගතියකුත් සකස්වෙලා තිබුණා. මම වහවහා ඇයව පිරිසිදු කරලා අම්මාට බත්

කවන්න සූදානම් වුණත් අම්මා ආහාර ප්‍රතික්ෂේප කළා. මාත් සමග අම්මා හිනාවෙන්නෙත් නෑ, කථා කරන්නෙත් නෑ. මට තේරුණා මගේ ප්‍රමාදය නිසා අම්මා බොරු තරහක් පෙන්වනවාය කියලා. මම අම්මාට දෙතුන් වතාවක් කිව් කැව්වා. ඒත්, සිනහ වෙන්නේ නැහැ. අම්මාට තොත්තු දෙක තුනක් ම දුන්නා. ඒත් සිනහ වෙන්නේ නැහැ. අම්මා බත් කන්න බැහැ කියන නිසා ම, බත් පිඟානේ බත් කටක් අනන ගමන් මම අම්මාට කිව්වා, අම්මේ, මම අම්මාට ලස්සන කතාවක් කියන්නම්කෝ, ඔන්න එකමත් එක රටක තොප්පි වෙළෙන්දෙක් හිටියා. ඒ තොප්පි වෙළෙන්දා දවසක් තොප්පි පෙට්ටියක් හිසේ තබාගෙන කැලයක් මැද්දෙන් ගම්මානයට යනකොට, තොප්පි වෙළෙන්දාට බඩගිනි දැනිලා, ගසක් මුල වාඩිවෙලා බත්මුල ලිහාගෙන ඔන්න තොප්පි වෙළෙන්දා බත් කටක් කෑවා, කියන ගමන් ම අම්මාට බත් කට කැව්වා. ඒ වෙලාවේ මගේ කතන්දරය අහලා ඇයට කොච්චර සිනාගියා ද කියලා කියනවා නම්, තව පොඩ්ඩෙන් බත් කටත් හිරවෙනවා. එදා රෝගාතුර අම්මාට වයස අවුරුදු හැත්තෑවක් පමණ ඇති. ගිහි මට අවුරුදු තිස්නවයක් පමණ ඇති. අවුරුදු තිස්නවයේ වයසේදීත් රෝගී අම්මාට තොප්පි වෙළෙන්දාගේ කතාව කියලා බත් කවපු දරුවෙක් තමයි අත්දැකීම් තුළින් ම අම්මාගේ ගුණය ගැන මේ සටහන තබන්නේ.

අම්මාගේ සතුටු කඳුළක මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම සැපයක් වගේ ම, උතුම් භව නිරෝධයට මාර්ගයත් සැඟවී තිබෙනවා. ඒ කියන්නේ මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගය ම සැඟවී තිබෙනවා. පින්වත් දරුවන් හොඳින් තේරුම් ගන්න ඕනේ, දෙමාපියන් සතුටු කරලා, අම්මා තාත්තගේ නෙතින් සතුටු කඳුළක් වැගිරුණොත්, එම සතුටු කඳුළ තුළ, මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ම අර්ථය සැඟවී තිබෙනවාය කියන කාරණය දකින්න.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවන් අතින් පංචශීලය දුර්වලවීම සිදුවෙනවා අඩුයි නේද?

පාසල් දරුවන් අතින් සිල්පද දුර්වලවීම අඩුයි කියලා කියන්න බැහැ. දරුවන් අතින් අප්‍රකට සිල්පද දුර්වල වන අවස්ථා ගොඩක් තිබෙනවා. පාසල් දරුවෙක් දෙමාපියන්ට අකීකරු වෙන මොහොතක් පාසා අම්මා තාත්තාට මානසිකව හිංසා කිරීමට අදාලව, පළමුවැනි සිල්පදය දුර්වලකොට ගන්නවා. ගුරුතුමා ගුරුතුමියට අකීකරු වෙන මොහොතක් පාසා එම දරුවා ගුරුවරයාව, මානසික හිංසනයට ලක් කිරීමට අදාලව පළමුවැනි සිල්පදය දුර්වලකොට ගන්නවා. එම දරුවා තම නංගි මල්ලි සමග රණ්ඩුවෙන මොහොතක් පාසා, තම නංගි මල්ලිව මානසික හිංසනයට පත්කිරීම හේතුවෙන් පළමුවැනි සිල්පදය දුර්වලකොට ගන්නවා. පුංචි දරුවෙක් කුහුඹුවෙක්, කඩියෙක්, කැරපොත්තෙක් මරණ, හිංසා කරන මොහොතක් පාසා පළමුවැනි සිල්පදය දුර්වලකොට ගන්නවා. දරුවන් අතින් අන්සතු දේවල් සොරකම් කිරීමෙන් වැළකීමේ සිල්පදය දුර්වල වෙන අවස්ථා තිබෙනවා. තාත්තාගේ අවසරයකින් තොරව, තාත්තාගේ මුදල් පසුම්බිය විවෘත කරනවා. හිටපු ගමන් සීනි බෝතලයේ සීනි, ශීතකරණයේ අතුරුපස අඩුවෙනවා. සමහර දෙමාපියන් කියනවා, අල්මාරිය උඩ තිබෙන සිල්ලර කාසි නිතර නැතිවෙනවාය කියලා. මේ සෑම මොහොතක ම දරුවන් අතින් බොරු කීමේ වරදක් සිදුවෙනවා. සමහර දරුවන් පාඩම් පොත ළඟ තබාගෙන වටපිට බලබලා ඉඳලා පාඩම් කළාය කියනවා. ගෙදර වැඩ තිබියදී ගෙදර වැඩ නැහැය කියනවා. මේ සෑම ක්‍රියාදාමයකදීම බොරු කීමට අදාළ අකුසලය සිද්ධ වෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, වතුර බිංදුව බිංදුව එකතු වෙලයි වතුර කළයක් පිරෙන්නේ කියලා. එම නිසා පාසල් දරුවන්, මෙත් සිත වර්ධනය තුළින් ශීලයේ ශක්තිය ජීවිතයට එකතුකොට ගන්න දක්ෂ වෙන්න ඕනේ. බුදුරජාණන් වහන්සේ කෙරෙහි කීකරු භාවයත්, මෛත්‍රියත්, ශීලයත් පාසල් දරුවෙකුගේ ජීවිතයට එකතු වුණ තැන, එම දරුවා ළමා වයසේදී ම ශ්‍රේෂ්ඨ ධනවතෙක් වෙනවා. ඒ කියන්නේ ලෞකික සැපය උරුම කොටගත් දරුවෙක් වෙනවා.

එවැනි දරුවන් දිව්‍යලෝකයට එන දවස එන තුරු සශ්‍රීක දෙවියන් දිව්‍යචක්ඛුවලින් බලාගෙන සිටිනවා. දිව්‍ය ලෝකයේ රසම රස කෑම ජාති තිබෙනවා. දිව්‍ය ලෝකයේ පාට පාට අයිස්ක්‍රීම් තිබෙනවා. දිව්‍ය ලෝකයේ අයිස් ක්‍රීම් හදන්නේ එළකිරිවලින්, පිටිකිරිවලින් නොවේ, අමෘතයෙන්. අමෘතය කියන්නේ පින නිසා ඇතිවෙන මේ ලෝකයේ ඉහළ ම රසයයි. පින්වත් ඔබගේ පාසලේ බොහොම මිහිරි හඬින් සින්දු කියන දරුවෙක් ඉන්නවා කියලා හිතන්න. එම දරුවාට මිහිරි කටහඬක් ලැබුණේ කවුරුවත් දුන්න නිසා නොවේ. එම දරුවාගේ පෙර පින නිසාමයි. දෙවියන්ගේ පෙර පින නිසා ම දෙවියන්ට අමෘතය කියන රසය පහළ වෙනවා.

දිව්‍ය ලෝකයේ දෙවියන් අයිස්ක්‍රීම් කන්නේ කෝප්පයකට බෙදාගෙන හැන්දෙන් නොවේ. දෙවියාට එයාගේ පින නිසා ම අයිස්ක්‍රීම් එකක් කන්න හිතනකොට ම, අයිස්ක්‍රීම් එකේ රසයෙන් එයාව පිනායනවා. දිව්‍ය ලෝකයේ අයිස්ක්‍රීම් කොච්චර අනුභව කළත්, සෙම අමාරු, පණු අමාරු හැදෙන්නේ නැහැ. පින්වත් දරුවන් පාසල් වයසේ සිටම මෙත් සිත පුහුණු කරමින්, සිල්පද ගැන, සතිය, සිහිය ඇති කොටගතහොත්, මෙවන් අසිරිමත් දිව්‍ය සැපයකට මාර්ගය ළමා වයසේදී ම ඇති කොටගත්තා වෙනවා.

සමහර පාසල් දරුවන් සිටිනවා, වැඩිහිටියෙක් අවවාදයක් කළොත්, එම අවවාදයට ගැටිලා, එම තරහා සිතේ සිරකරගෙන සිටිනවා. යාළුවෙක් සමග රණ්ඩු වුණොත් එම තරහා සිතේ සිරකරගෙන සිටිනවා. පුංචි සිත්වල කේන්තිය සිරකරගෙන ඉන්න එපා. පුංචි සිත්වල කේන්තිය සිරකරගෙන සිටිනකොට ඔබේ පුංචි ශරීරයට එම කම්පනයන් දරාගන්න බැහැ. කේන්තිය සිතේ සිරකරගෙන ඉන්න දරුවන්ට නරක නපුරු ලෙඩරෝග හැදෙනවා. කේන්තිය සිතේ සිරකරගෙන සිටින නිසා ම, කේන්තිය ඔබේ ජීවිතයේ කොටසක් බවට පත්වෙනවා. මනුෂ්‍ය ලෝකයේ මාමලා නැන්දලාට ඔබේ සිත දකින්න බැරි වුණාට, දිව්‍ය තලවල දෙවියන්ට පුංචි ඔබේ සිත දකින්න පුළුවන්. එම නිසා පුංචි ඔබේ සිතේ සඟවාගෙන සිටින කේන්තිය දෙවියන්ට සඟවගන්න බැහැ. දෙවියන් පුංචි දරුවන් කේන්තිය සිතේ සිරකරගෙන සිටිනවා

දකලා, එවැනි දරුවන් කෙරෙහි කලකිරෙනවා. එවැනි දරුවන්ගෙන් දෙවියන් ඈත්වෙනවා. එවිට කේන්තගන්න දරුවන් ළඟට ළං වෙන්නේ, කේන්තියට කැමති යක්ෂයින්, අමනුෂ්‍යයින් වගේ බොහෝ ම නපුරු නරක අයමයි. එය දරුවන්ට හරි ම අනතුරුදායක වෙනවා. නරක, නපුරු, කේන්තියට කැමති අමනුෂ්‍යයින් දරුවන්ට ළං වුණොත් එම දරුවන්ට නිරතුරුව ම විසුරුණු සිතක උරුමයයි ලැබෙන්නේ. ඒ නිසා ම එම දරුවා තුළ අකුසල් පක්ෂය වැඩෙනවා, පෙර කුසල් යටපත්, වෙලා යනවා. කේන්තිගන්න දරුවා, කේන්තිය වඩන දරුවා, නිරතුරුව ම තමාගේ විනාශයේ දොර කවුළු තමා විසින් ම විවෘත කොට ගන්නවා. කේන්තිය නිවා දමන සැබෑ ම ජලය වන්නේ මෛත්‍රියෙන් පෝෂණය වූ ශීලයයි. මෛත්‍රියෙන් පෝෂණය වූ ශීලයට ශ්‍රද්ධාව එකතු වුණ තැනදී එම පින්වත් දරුවා බෝසත් දරුවෙක් වෙනවා. පාසල් දරුවන්ට නැවතත් මතක් කොට දෙනවා, දරුවන්, දෙමාපියන්ට, ගුරුවරුන්ට අකීකරු වෙන මොහොතක් පාසා ම, දරුවන් අතින් මනුෂ්‍ය හිංසනයට අදාළ පළමුවෙනි සිල්පදය දුර්වල වෙනවාය කියන කාරණය. මෙය බලවත් විපාකයක් සහිත සිල්පද බිඳීමක් වෙනවා. මහා බ්‍රහ්මයාගේ සිත රිදෙව්වා හා සමාන අකුසලයක් දරුවන් මෙතැනදි සකස් කොට ගන්නවා. රහතන් වහන්සේ නමකට අකීකරු වුණා හා සමාන අකුසලයක් දරුවන් මෙතනදී සකස් කොට ගන්නවා.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවන් නැටුම් හා සංගීතය හැදෑරීමට සුදුසු ද?

ව්‍යාපාරික අරමුණු මුල් කොටගෙන මාධ්‍ය විසින් ඇති කොට ඇති නොවටිනා, වටිනාකම් හේතුවෙන් දරුවන් නැටුම් හා සංගීත අංශයන්ට යොමුවීම වැඩි වෙනවා. පාසල් දරුවන්ට නැටුම් හා සංගීතය විෂය සුදුසු නැහැයි කියල භික්ෂුවට කියන්න බැහැ. ගිහි පින්වතුන්ලා පසළොස්වක පෝය දවසට උපෝසත සීලය සමාදන් වුණොත්, නැටුම්, ගැයුම් වැයුම්වලින් වෙන්වෙලයි, එම සිල්වන්ත පින්වතුන් ජීවත් විය යුත්තේ. උපසම්පදා භික්ෂූන් වන අපට බුදුරජාණන්

වහන්සේ නැටුම් බලන්න, චිත්‍රපට බලන්න, සංගීත සංදර්ශන බලන්න යාම, සිංදු කීම, මේවා විනයානුකූලව තහනම් කරලයි තිබෙන්නේ. නමුත් පංචශීලය ආරක්ෂා කොටගෙන ජීවත්වීමේ දී බුදුරජාණන් වහන්සේ ගිහි පින්වතුන්ලාට නැටුම්, ගැයුම්, වැයුම් තහනම් විෂයක් බවට පත් කොට නැහැ.

භික්ෂුවට මතකයි, මමත් පාසල් ශිෂ්‍යයෙක් හැටියට නැටුම් විෂය ඉගෙනගත්තා. මගේ පාසැල් නැටුම් ගුරුතුමා වූයේ බැසිල් මිහිරිපැන්න මහත්මයා. එතුමා සෑම වෙලාවේ ම නැටුම් පන්තියේ වාඩිවෙලා සිටියේ දිග වයලීනයක් ලොකු බෙරයක් ළඟ තබාගෙනයි. එතුමා බොහෝ ම නිහඬ, තැන්පත් ගුරුමහත්මයෙක්. ඒ නිහඬතාවය, තැන්පත්භාවය එදා ශිෂ්‍යයෙක් වශයෙන් මට ප්‍රශ්නයක් වුවත්, මට දැන් වැටහෙනවා එතුමාගේ නිහඬ තැන්පත්භාවය නැටුම් විෂය තුළින් උපන් සමාධිමත්, දැහැන්ගත වීමක ඵලයක්ය කියලා. පින්වත් පාසල් දරුවන් නැටුම්, සංගීත විෂයන් ජීවිතයට එකතු කොට ගත යුත්තේ නොසන්සුන් ජීවිත තවතවත් නොසන්සුන් කර ගැනීමට නොවේ. නොසන්සුන් ජීවිත සරලභාවයට පත් කොට ගැනීමටයි, සංගීතමය, නර්තනමය සමාධිමත් දැහැන්ගත වීමක් තුළින් ලබන නොවිසුරුණු මානසික ස්වභාවයක් ඇති කොට ගැනීමටයි. ඒ නොවිසුරුණු මානසික ස්වභාවය පින්වත් දරුවන්ට අධ්‍යාපන කටයුතුවලදීත්, විනය පවත්වාගෙන යාමේදීත් ලොකු ශක්තියක් වෙන්න පුළුවන්.

පින්වත් දරුවන් සංගීත ගුරුතුමා ගහන බෙරපදයට ශරීරය රිද්මයකට නැටෙව්වාට කමක් නැහැ. පින්වත් දරුවන් නැටුම්, ගැයුම්, වැයුම් නිසා පුංචි සිතට අවිචාරවත් අන්දමට නටන්න නම් දෙන්න එපා. මුදලට තෘෂ්ණාවෙන් බැඳුණු සමහර මාමලා, නැන්දලා දේශීය නැටුම් කලාවට මුවාවෙලා නැටුම් ශිල්පියාගේ රූපය ඉස්මතුකොට පෙන්වා කෙරෙන අශීලාචාර නැටුම්, සංගීත කලාවක් නම්, පාසල් දරුවන්ට අවශ්‍ය වෙන්නේ ම නැහැ.

වරක් බුදුරජාණන් වහන්සේ මුණගැසීමට පැමිණි තව්තිසාවේ සංගීතයට අධිපති පන්සිළු දෙවියා ඒ මොහොතේ තමන් අත්විඳිමින් සිටි විරහ වේදනාව, බේලුව පාණ්ඩු වීණාව වාදනය කරමින් ගීතමය

සංයමයෙන් බුදුරජාණන් වහන්සේ ඉදිරිපිට වාඩි වී ගායනා කළා නිහඬව, නික්ලේෂීව පන්සිළු දෙවියාගේ සංගීතමය ගීත පෙළ ශ්‍රවණය කළ බුදුරජාණන් වහන්සේ, පන්සිළු දෙවියාට දේශනා කරනවා. පන්සිළු, ඔබේ වීණාවේ තත් හඬ, ඔබේ කටහඬ ඉක්මවා ගියේ නැහැ. ඔබේ කටහඬ වීණාවේ තත් හඬ ඉක්මවා ගියේ නැහැයි කියලා. ඔබ සංගීතයත්, කටහඬත් සමබරව පවත්වාගෙන යමින් ගීත ගායනය ඉදිරිපත් කළාය කියලා, පන්සිළු දෙවියන්ව සතුටට පත් කළා.

ඒ වගේමයි සෑම පසළොස්වක පොහොය දිනක ම තව්තිසාවේ ශක්‍ර දෙවියාගේ ප්‍රධානත්වයෙන් රැස්වෙන සුදම් සභාවේදී මහේශාඛ්‍ය දෙවියන් නර්තනයෙන් පිනවන, සූර්ය වර්චසී කියලා හිරු සේ ප්‍රභාශ්වර දිව්‍යාංගනාවක් ගැන සූත්‍රගත ධර්මයේ සඳහන් වෙනවා. දිව්‍යතලවල මහේශාඛ්‍ය දෙවියන් නර්තනයෙන් සංගීතයෙන් පිනවන දෙවියන්, දිව්‍යාංගනාවන් සිටිනවා. දිව්‍යතලවල මනුෂ්‍ය ලෝකයේ වගේ ගොරහැඬි, අධිවේගී, අඩ නිරුවත්, අසංවර නර්තනයත් සංගීතයත් නැහැ. ශාස්ත්‍රීය සංගීතය හා නර්තනය තමයි දිව්‍යතලවල දෙවියෙන්ගේ දිව්‍යාංගනාවන්ගේ දිව්‍ය සංගීතය, නර්තනය වෙලා තිබෙන්නේ. වයලීනය, තබ්ලාව, වීණාව, සිතාරය අතැතිවයි එවැනි සංගීත උපාදානයන් ඇතිකොටගත් දෙවියන්, දිව්‍යාංගනාවන් ඕපපාතිකව දිව්‍යතලවල උපදින්නේ. දිව්‍යතලවල නාට්‍යාංගනාවන් බොහෝ ම සංවරයි, විනයගරුකයි. එම දිව්‍ය නාට්‍යාංගනාවන් නර්තනයන් ඉදිරිපත් කරන්නේ, ශාස්ත්‍රීය නර්තන ශෛලීන්ට අනුව ඉන්දියානු සාරිය, අත්දිග හැට්ටය, දිගට ගොතා දෙපතුල දක්වා මුදාහළ කෙස්වැටිය, නළල් තලයට, දෑතට, දෙපයට පින නිසා ම පහළ වූ දිව්‍ය ආභරණ සහිතවයි.

දිව්‍ය නාට්‍යාංගනාවන් රඟ දක්වන නර්තනයකදී මොන ම අවස්ථාවකදීවත්, ප්‍රේක්ෂක දෙවියන් තුළ රාගයක් සකස් වෙන්නේ නැහැ. රාගී සිත් නිවන, දැහැන්ගත සමාධියකට සමවැදිලයි දෙවියන් දිව්‍ය සංගීතය, නර්තනය රස විඳින්නේ. දිව්‍යතලවල ජීවත් වෙන මේ සෑම නර්තනයට, සංගීතයට යොමු වූ දිව්‍යාංගනාවක් ම, දෙවියෙක් ම පෙර ජීවිතයේ, මනුෂ්‍ය ලෝකයේ පංචශීලය ආරක්‍ෂා කොටගෙන

පින්කම් සිදු කරමින් නර්තනය, සංගීතය උපදානය කොටගෙන ජීවත් වෙච්ච ගෞරවනීය කලාකරුවන්. වර්තමානයේ කලාවේ නාමයෙන්, සංගීතය, නර්තනය නාමයෙන්, තමනුත් සිල්පද දුර්වල කොටගෙන ප්‍රේක්ෂකයාගේ ද සිල්පද දුර්වල කොට දමමින්, මෝහය වඩන විකාරරූපී නැටුම් නටන, සින්දු කියන, මාමලා නැන්දලාට නම් සිහිනයකින් වත් දිව්‍යතලවල සංගීතයට නර්තනයට යොමු වූ දෙවියෙක්, දිව්‍යාංග නාවක් වෙන්න බැහැ. එවැනි විකාරරූපී නැටුම් නටන පින්වතුන්ලාට මරණින් පසුව මහා සාගරයේ මාළුවෙක් වෙලා, දිය මත ලස්සනට පීනපීනා ඉන්න නම් පුළුවන්. ලස්සන කුරුල්ලෙක් වෙලා ගසක අත්තක ලැගගෙන ලස්සනට සින්දු කියකියා ඉන්න නම් පුළුවන්. එම නිසා පින්වත් දරුවන්, නර්තනය, සංගීතය ජීවිතයට එකතුකොට ගත යුත්තේ, පංච ශීලයේ ආරක්ෂාව තුළ සිටිමින්මයි. යම් දරුවෙක් කලා කටයුතුවලට සම්බන්ධ වන තැනදී, මෛත්‍රියට වඩා ජීවිතයට අත්‍යවශ්‍ය වන්නේ ශීලයේ ආරක්ෂාවයි. කලා කටයුතුවලදී පංචශීලයෙන් තොර මෛත්‍රිය දරුවාව අනාගත අනතුරුවලට පත්කරන්න පුළුවන්කම තිබෙනවා. යම් දරුවෙක් පංචශීලයෙන් දුර්වලවෙන තැනදී නැටුම් කලාව, සංගීතය ඔබව සදාචාරාත්මක පිරිහීම දෙසටත්, අවසානයේ සතර අපාය දෙසටත් මාර්ගය විවර කොට දෙනවා. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ, ශීලයේ දුර්වලභාවය නිසා සමාජය තුළ මතුවෙන හේතුඵල ධර්මයන් කාටවත් ම වලක්වන්න බැහැ. නමුත් ධර්මානුකූලව ආරක්ෂා වීමේ මාර්ගය පින්වත් ඔබ ඉදිරියේ විවෘතව තිබෙනවා.

පින්වත් දරුවන් ඔබේ නැටුම් ගුරුතුමා ගහන බෙරපදයට නැටුම ආරම්භ කිරීමට මොහොතකට පෙර, ඔබේ සංගීත ගුරුතුමා වයන සංගීතයට ගායනය ආරම්භ කිරීමට මොහොතකට පෙරාතුව, ඔබ සශ්‍රීක දිව්‍යතලයක, නර්තනයෙන්, සංගීතයෙන් මහේශාඛ්‍ය දෙවියන් පිනවන දෙවියෙක්, දිව්‍යාංගනාවක් වෙනවාය කියන, උපාදානය ඇති කොට ගෙන ඔබේ කලා කටයුත්තකට යොමු වෙන්න. එවිට දරුවන් තුළින්, දෙවියෙක් වීමට අවශ්‍ය පංචශීලය, සුරක්ෂිත කරගැනීමේ කැමැත්ත ස්වයංක්‍රීයව ඇති වෙනවා.

සෝවාන් ඵලයට පත්ව සිටි විශාකා උපාසිකාව, පූර්වාරාමය විහාර සංකීර්ණය බුදුරජාණන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නයට පූජා කරලා, ඇති වූ නිම්හිම් නැති සතුට නිසා ම විශාකාව තම ඥාතීන්, යෙහෙළියන් පිරිවරා ගෙන පූර්වාරාම භූමියේ බොදු ගීතයක් ගායනා කරමින් සතුටු වුණා. මේ සිද්ධිය දැක්ක ස්වාමීන් වහන්සේ නමක්, බුදුරජාණන් වහන්සේට සැල කරනවා, භාග්‍යවතුන් වහන්ස, විශාකා උපාසිකාවගේ පිත කිපිලා ද කොහෙ ද, පූර්වාරාම පන්සල් භූමියේ ගීත කියනවාය කියලා. ඒ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා විශාකා උපාසිකාවගේ පිත කිපිලා නොවේ, ඇය ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ අග්‍රදායිකාව වීමේ නිම්හිම් නැති සතුටයි ඔය ප්‍රකාශ කරන්නේ කියලා.

උතුම් සෝවාන් ඵලයට පත් වෙච්ච විශාකාවටත් ලස්සනට ගීත කියන්න හැකියාව තිබුණා. එහෙම නම් ප්‍රශ්නය තිබෙන්නේ, නර්තනයේවත්, ගායනයේවත් නොවේ. එම නර්තනය, ගායනය ඉදිරිපත් කරන ඔබේ සිතුවිලි පංචශීලයෙන් පෝෂණය වෙනවාද නොවෙනවාද කියන කාරණය තුළයි. පංචශීලයේ ආරක්ෂාවෙන් තොර නර්තනය, සංගීතය පින්වත් දරුවන්ට එපාමයි කියලයි භික්ෂුව මතක් කොට දෙන්නේ.

ස්වාමීන් වහන්ස, පාසල් දරුවන්ට අරපිරිමැස්ම ගැන පහදලා දෙන්න.

බුදුරජාණන් වහන්සේ උපසම්පදා භික්ෂූන් වන අපට අරපිරිමැස්ම ගැන ලස්සන අවවාදයක් කර තිබෙනවා. යම් ස්වාමීන් වහන්සේ නමක් තමන් පාවිච්චි කරන සිවුර හොඳට ම දුර්වල වුණාට පස්සේ එම දුර්වල සිවුර අපට කසළ ගොඩට දමන්න බැහැ. බුදුරජාණන් වහන්සේ කියලා තිබෙන්නේ, එම පොරවන්න බැරි සිවුර සැතපෙන ඇඳේ ඇතිරිල්ලට පාවිච්චි කරන්නය කියලා. ඇඳේ ඇතිරිල්ලට පාවිච්චි කරන්න බැරි තත්වයට පත්වෙනකොට කොට්ට උරයකට, කොට්ටයකට පාවිච්චි කරන්නය කියලා. ඉනුත් පස්සේ එය පාපිස්නාවකට පාවිච්චි කරන්නය කියලා. බුදුරජාණන් වහන්සේ අරපිරිමැස්ම ගැන වටිනා අර්ථයක් තම ශ්‍රාවකයන්ට ඉහත ධර්මයෙන් මතක් කොට දී තිබෙනවා.

ඉහත කාරණය කියවන කොට පින්වතුන් තුළ සිතුවිල්ලක් ඇති වෙන්න පුළුවන්, ඉහත ක්‍රමවේදය තුළ ලෝභකම නේද තිබෙන්නේ කියලා. ඔබට එසේ සිතුණා නම් එය සම්පූර්ණයෙන් වැරදියි. අරපිරිමැස්ම කියන අර්ථය ලෝභකම කියන අර්ථයට පටලව ගන්න එපා. මෙතනදී බුදුරජාණන් වහන්සේ උත්සාහ ගන්නේ එම සිවුරු පූජා කළ පින්වතාට පිනේ උපරිම ප්‍රතිලාභයක් අයිතිකොට දීමටයි. යම් හෙයකින් එම ස්වාමීන් වහන්සේ සිවුර දුර්වල වුණ අවස්ථාවේදී ම කසළ ගොඩට දැම්මා නම් ඇඳ ඇතිරිල්ල, කොට්ට උරය, පාපිස්නාව තුළින් රැස්වෙන පින ඔහුට අහිමි වෙනවා. බුදුරජාණන් වහන්සේගේ මෙවැනි ඉගැන්වීම් තුළින් ශ්‍රද්ධාවෙන් පූජා කරන සාංඝික සිවුපසය අරපරිස්සමින් පරිහරණය කොට ගිහි පින්වතුන්ලාගේ ශ්‍රද්ධාව තවතව වර්ධනය කොට දෙනවා. එය ශාසනික පෝෂණයට බලවත් රුකුලක් වෙනවා වගේ ම, ගිහි පින්වතුන්ලා තුළ සංඝ රත්නය කෙරෙහි ගරුත්වය වැඩිවෙනවා.

දරුවෙකුට තාත්තා සවසට ටොෆි දෙකක් ගෙනත් දෙනවා. එම දරුවා ඉන් එක ටොෆියක් ඔතලා පරිස්සම් කොට තබාගන්නවා, හෙට උදේට ස්වාමීන් වහන්සේ නමකට පිණ්ඩපාතයට බෙදන්න. මෙම දරුවා තාත්තා ගෙනත් දුන්න ටොෆි දෙකෙන් එකක් තමනුත් රස විඳ, දෙවනුව දෙමාපියන්ටත්, තමන්ටත් සාංඝික දානමය කුසලය ජීවිතයට එකතුකොට ගන්න දක්ෂ වෙනවා. මෙතැනදී අරපිරිමැස්ම කියන අර්ථය තිබෙන්නේ, තමන්ට ලැබෙන දෙයින් උපරිම ප්‍රයෝජනය මතුකොට ගන්නවා. ප්‍රයෝජනයක් නොගෙන, සඟවාගෙන, ගොඩ ගසාගෙන ඉන්නවාය කියන කාරණය අරපිරිමැස්මට අදාළ නැහැ.

පින්වත් දරුවන්ට ලැබිලා තිබෙන සෑම දෙයක් ම පරිස්සමින් පරිහරණය කරන්න දරුවන් දක්ෂ වෙන්න ඕනේ. මුලින් ම ඔබ පරිස්සම්කොට ගත යුත්තේ ඔබේ ඇස, කණ, නාසය, දිව, ශරීරය කියන ඔබේ රූපයයි. සෙල්ලම් කරන වේලාවට, දඟකරන වේලාවට, මහ පාරේ ගමන් කරන වේලාවට, ගස් උඩ නගින වේලාවට, බස් රථයේ පාපුවරුවේ යන්න හිතෙන වේලාවට, අවුරුද්දට රතිඤ්ඤා පත්තු කරන්න හිතෙන වේලාවට, ගඟේ මුහුදේ නාන්න යන්න

සිතෙන වේලාවට දරුවන් ගොඩක් පරිස්සම් වෙන්න ඕනේ. අනවශ්‍ය දේවල් කිරීම සඳහා ඇතිවෙන සිතුවිලි පින්වත් දරුවන් පරිස්සමින් කළමනාකරණය කොටගැනීමට දක්ෂ වෙන්න ඕනේ.

දරුවන්ගේ ජීවිත පිටිපස්සේ කුසල් මෙන් ම අකුසල් ද තිබෙන නිසා දරුවන්ට අනවශ්‍ය දේවල්වලට, අනතුරුදායක දේවල්වලට සිත යොමුවෙන්න පුළුවන්. එම නිසා දෙමාපියන්ගේ අවසරයකින් තොරව ඉහත ක්‍රියාකාරකම්වල යෙදෙන්න එපා. පින්වත් දරුවන්ගේ සිතට නැඟෙන සිතුවිලි හොඳ, නරක, යහපත, අයහපත තෝරාබේරාගෙන අරපිරිමැස්මෙන් ක්‍රියාත්මක වෙන්න, දරුවන් දක්ෂ වෙන්න ඕනේ. සිත කියන්නම් වාලයේ දුවන දරුවෙක් වෙන්න එපා. අනික සංස්කාරයන්ට පුරුදුවලට අදාළව දුවන සිත දමනය කොටගත් දරුවෙක් වෙන්න.

දෙමාපියන් කොච්චර මහන්සි වෙලා ද, දරුවන්ට ඇඳුම්පැළඳුම්, පතපොත දරුවන්ගේ සැපයට අදාළ සියලුම දේවල් ගෙනල්ලා දෙන්නේ. එම නිසා දෙමාපියන් දරුවන්ට මොන දෙයක් ගෙනත් දුන්නත් දෙමාපියන් සතුටු වන ආකාරයට එම දේවල් පරිහරණය කරන්න දක්ෂ වෙන්න. දෙමාපියන් ලබාදෙන දෙය දරුවන් බොහෝම ඉක්මනින් කඩා බිඳ දමනවා නම්, නැතිකර ගන්නවා නම් එවැනි දරුවන් දෙමාපියන්ගේ සතුට ආරක්ෂා නොකළා වෙනවා, දෙමාපියන්ට ලැබිය යුතු වූ පින අහිමි කළ දරුවෙක් වෙනවා, දෙමාපියන් කැප කළ මුදලට වටිනාකමක් ලබා නොදුන් දරුවෙක් වෙනවා, දෙමාපියන්ට මෙත් නොවැඩූ දරුවෙක් වෙනවා.

ඒ වගේමයි, පාසල් දරුවන් පාසලේ තිබෙන සෑම සම්පතක් ම ප්‍රවේශමෙන් ආරක්ෂාකොට ගන්න ඕනේ. එවිට ඔබ අහිංසක මාමලා, නැන්දලා භාණ්ඩාගාරයට ගෙවන බදු මුදල් අරපරිස්සමින් පරිහරණය කළා වෙනවා. භාණ්ඩාගාරයට බදු ගෙවන ජනතාව අතර ඔබේ දෙමාපියනුත්, ගුරුවරුනුත්, දරුවන් වන ඔබත් සිටිනවා. එම නිසා පාසලේ සම්පත් පරිස්සම් නොකරනවායි කියන්නේ, දරුවන් ඔබේ ම දෙයක් පරිස්සම් නොකළා වෙනවා. පින්වත් දරුවන් පාසලේ සම්පත් අරපරිස්සමින් පරිහරණය කරන මොහොතක් පාසා එම දරුවන් බදු ගෙවන ඔබත් ඇතුළු සමස්ත ජනතාවට මෙත් සිත පැතිරුවා ද වෙනවා.

වැඩිහිටි පාසල් දරුවන් ඇඳුම්පැළඳුම් තෝරා ගැනීමේදී හුඟක් පරිස්සම් වෙන්න ඕනේ. පින්වත් දරුවන් ඇඳුමක් තෝරා ගැනීමේදී වර්ණය, මෝස්තරය, ප්‍රමාණය, මිල ගැන පමණක් නොවේ, ශීලාචාරකම්, හැදියාවන්, අපේ සංස්කෘතිය ගැනත් හිතා බලන්න ඕනේ. සදාචාරාත්මක ගුණධර්මයන් නොතකන ඇඳුම් කලාවක් වර්තමාන සමාජයේ බිහිවෙලා තිබෙනවා. විශේෂයෙන් ගැහැනු දරුවන්ගේ ශරීරය නිරාවරණය වෙන, ශරීරය බාහිර සමාජයට උලුප්පා පෙන්වන නොගැලපෙන ඇඳුම් පරිහරණය කරන්න එපා. රූපය කියන්නේ කාම වස්තුවක්. ඇඳුම් කියන්නේ කාම වස්තුවක්. මේවා වැරදි විදියට පරිහරණය කළොත් පුංචි ආස්වාදයක් තිබුණත් ආදීනවයන් හුඟක් බරපතල වෙනවා.

තුසිතය, යාමය, නිම්මාණරතිය, පරනිම්මිත වසවර්තිය, චාතුර්මහා රාජිකය කියන සශ්‍රීක දිව්‍යතලවල ලස්සන දිව්‍යාංගනාවන් ජීවත් වෙනවා. මේ කිසි ම දිව්‍යාංගනාවක් නිරුවතින් හෝ අඩනිරුවතින් නැහැ. කොට කලිසම්, කොට සාය, දිග කලිසම් පැළඳගෙන නැහැ. දිව්‍යතලවල ජීවත්වෙන සෑම දිව්‍යාංගනාවක් ම මුළු ශරීරය ම වැසෙන දිව්‍ය සළුවලින් සැරසිලයි සිටින්නේ. සෑම දිව්‍යාංගනාවකගේ ම දිව්‍ය ඇඳුම් දෙපතුල දක්වා දිගටයි තිබෙන්නේ. එම දිව්‍ය සළුපිළි ඉතාමත් සිනිඳු වුවත් ශරීරය විනිවිද පෙනෙන්නේ නැහැ. මනුෂ්‍ය ලෝකයේ නැන්දා කෙනෙක් සාරියකින්, හැට්ටයකින් සැරසිලා සිටින කොට සාරියත් හැට්ටයත් අතර අඟල් දෙක තුනක හෝ ශරීරය නිරාවරණය වෙලානේ තිබෙන්නේ. සශ්‍රීක දිව්‍යතලවල දිව්‍යාංගනාවන්ගේ එවැනි පුංචි හෝ ශරීරය නිරාවරණය වීමක් නැහැ. දිව්‍යාංගනාවන්ගේ දිව්‍ය ජීවිත සදාචාරයෙන්, විනයෙන් පෝෂණය වෙලයි තිබෙන්නේ. දිව්‍යාංගනාවක් කියන්නේ පෙර ජීවිතයේදී වචනයෙන්, ක්‍රියාවෙන් ඇඳුමෙන් පැළඳුමෙන් සංවර ව ජීවත් වූ මනුෂ්‍ය ලෝකයේ ම කාන්තාවන්. ඒ සංසාරික යහපත් පුරුදු, දිව්‍ය ජීවිතයේදීත් උරුම වෙලා තිබෙනවා.

නමුත් පරනිම්මිත වසවර්තිය කියන වසවර්ති මාරයාට අයත් දිව්‍යතලයේ තත්වය මීට වඩා වෙනස්. එම දිව්‍යතලයේ ජීවත් වෙන සුරූපී දිව්‍යාංගනාවන් තුන්දෙනෙක් සිටිනවා. එම දිව්‍යාංගනාවන්

වසවර්ති මාරයාගේ දියණියන් වශයෙනුයි හඳුන්වන්නේ. මේ දිව්‍යාංග නාවන්ගේ පැහැය ඉදුණු ජම්බෝල ගෙඩියක් කැපුවාම තිබෙන රෝස පැහැයට සමානයි. මෙම දිව්‍යාංගනාවන් තුන්දෙනා ම හරි ම අශීලාචාර දිව්‍යාංගනාවන්. මේ දිව්‍යාංගනාවන් තුන්දෙනාත් ඔවුනගේ පිරිවර දිව්‍යාංගනාවනුත් අඩනිරුවතින් පවා සිටින අවස්ථා තිබෙනවා. මෙම දිව්‍යාංගනාවන් රූපයේ ආස්වාදයෙන් මත්වෙලායි සිටින්නේ. කාමච්ඡන්දයට රුචි, ශීලාචාර ධර්මයන් අකමැති පරනිම්මිත වසවර්ති දිව්‍යතලයේ මාර දූතියන්ගේ පිරිවර දිව්‍යාංගනාවන් නිරතුරුව අකුසලය තුළමයි ජීවත් වෙන්නේ.

පින්වත් දරුවන් හොඳින් මතක තබා ගන්න ඕනේ, තමා තුළත් අනුන් තුළත් රූපයේ ආස්වාදය වැඩෙන, නොගැළපෙන ඇඳුම්පැළඳුම් පළඳින කිසි ම දරුවෙකුට ඊළඟ ජීවිතයේදී සශ්‍රීක දිව්‍යතලයක දිව්‍යාංගනාවක් වෙන්න නම් බැහැ. හැබැයි නොගැළපෙන ඇඳුම් පළඳින දරුවන්ට මීළඟ ජීවිතයේදී පරනිම්මිත වසවර්ති දිව්‍යතලයේ මාරදූතියන්ගේ දිව්‍ය පිරිවර අතර උපදින්න නම් පුළුවන්කම තිබෙන්නට පුළුවන්. හැබැයි එතනට යන්නත් දරුවන්ට පින සහ ශීලයේ ශක්තිය ජීවිතය තුළ තිබෙන්න අවශ්‍යයි. නමුත් මෙම දිව්‍ය ජීවිතය නිරතුරුව සතර අපායේ අනතුරට විවෘතවයි තිබෙන්නේ.

ඒ වගේමයි ප්‍රේත ලෝකයේ ඕනෑ තරම් නිරුවතින්, අඩ නිරුවතින් ජීවත් වෙන ප්‍රේතයන් සිටිනවා. සෑම තිරිසන් සතෙක් ම ජීවත් වෙන්නෙත් නිරුවතින්මයි. මෙම සත්වයින්ට මෙසේ වීමට හේතුව වෙන්නේ පෙර මනුෂ්‍ය ජීවිතවල ඉපදිලා, තම ශරීරය බාහිර සමාජයට කෙළෙස් ඇති වන ආකාරයට පරිහරණය කිරීමයි. පෙර පින නිසා ම දරුවන් වන ඔබට ලැබුණු මේ සුන්දර රූපය අනුන් තුළ කෙළෙස් ඇති වන ආකාරයට ඔබ පරිහරණය කළොත්, මතු භවයක නිරුවත් ප්‍රේත, තිරිසන් සමාජයේ සාමාජිකත්වය ලැබීමේ අනතුරට ඔබව පත් වෙන්න පුළුවන්. එම නිසා ළමා කාලයේ පටන් ම සතියෙන්, සිහියෙන් යුතුව ඇඳුම්පැළඳුම් තෝරා ගැනීමට දරුවන් දක්ෂ විය යුතුයි.

වැඩිවියට පත්වෙච්ච පාසල් ගැහැනු දරුවෙක්, පිරිමි දරුවෙක් අනාගතයේ දෙමාපියන්ගේ ආශිර්වාදයෙන් පතිකුලයට යන දවස

දක්වා දිවිහිමියෙන් ආරක්ෂාකොට ගත යුතු උතුම් ධර්මයක් සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ තිබෙනවා. ඒ උතුම් අර්ථය තමයි කුමර බඹසර, කුමරි බඹසර කියන්නේ අතීතයේ වැඩිහිටියන් දිවිහිමියෙන් ආරක්ෂාකොට ගෙන පැමිණි යහපත් සදාචාරාත්මක ධර්මයන් පින්වත් දරුවන් ආදර්ශයෙන් ම ජීවිතවලට එකතු කොට ගන්න ඕනේ. නමුත් මොකක්දෝ අවාසනාවකට වර්තමානයේ කුමර බඹසර, කුමරි බඹසර කියන අර්ථය කොයිහැටි වෙතත් මෙම වචන පවා භාවිතයෙන් ඈත් වෙලයි තිබෙන්නේ. වටිනාකම් නොවටිනාකම් බවට පත් වී, නොවටිනාකම්, වටිනාකම් බවට පත්වන සංස්කෘතියක් තුළයි වර්තමානයේ දරුවන් ජීවත් වෙන්නේ. ඒත් කලබල වෙන්න අවශ්‍ය නැහැ. වර්තමානයේ පින්වත් ඔබට අසන්නට ලැබෙන '**තෙරුවන්**' කියන සැනසිලිදායක වචනයත්, අර්ථයත් අනාගතයේ යම් දවසක අතුරුදහන් වී යනවා. මෙන්න මේ වෙනස්වන ලෝක ධර්මතාවයන් පිළිබඳ දැක්ම පින්වත් දරුවන් හඳුනාගෙන, ජාතියට උරුම යහපත් ශීලාචාර ධර්මතාවයන් හැකිතාක් කාලයක් නොවෙනස්ව, ආරක්ෂාකොට ගැනීමට උත්සාහගත යුතුව තිබෙනවා. වෙනස්වන ධර්මතාවයන් යම්තාක් කාලයක් නොවෙනස්ව ආරක්ෂාකොට ගත හැක්කේ, පින්වත් දරුවන් ජාතියට උරුම වෙනස්වන උතුම් ශීලාචාර ධර්මයන් ආරක්ෂාකොට ගෙන ජීවත්වෙන තාක් පමණක් ම ය.

වැඩිවියට පත් ගැහැනු දරුවෙක්, පිරිමි දරුවෙක් හොඳින් අධ්‍යාපන කටයුතු අවසන් කරලා, අනාගතයේ යම් දවසක දෙමාපියන්ගේ, වැඩිහිටියන්ගේ ආශිර්වාදයෙන් පතිකුලයට යන දවසේ, මධු සමයේ මධු සයනය මත අතුරන සුදු පිරිවටය මත සටහන් වන රතු ලේ සලකුණ, ජාතියේ ශීලාචාරකම, සදාචාරය, විනයගරුකභාවය ගැන ලස්සන පාඩමක්, වටිනා පාඩමක් ලෝකයට ම කියලා දෙනවා. මේ උතුම් ශීලාචාර ධර්මයන් වැඩිහිටි ළමා කාලයේ පටන් ම ආරක්ෂාකොට ගන්නා දරුවන්ට දෙවියන් පවා වන්දනා කරනවා. මේ දරුවා අපේ දරුවෙක්, මේ දරුවා දිව්‍ය දරුවෙක් කියලා දෙවියන් එම දරුවන්ට ආශිර්වාද කරනවා. එවැනි පින්වන්ත දරුවන් තම අධ්‍යාපන කටයුතුත් සාර්ථක කොට ගෙන යහපත් මනුෂ්‍ය ජීවිතයක් ගතකොට අවසානයේ සුගතියේ දෙවියන් අතර ම උපත ලබනවා. එම නිසා

පින්වත් දරුවන්ට පාසල් වයසේදී ම, දැක්මක් තිබෙන්නට ඕනේ, අධ්‍යාපනයත්, අනාගතයත්, සුගතියත් කියන කාරණා තුන පිළිබඳව ම එසේ නොවී දරුවන් හොඳින් අධ්‍යාපනය හදාරා, හොඳ වැඩිහිටි ජීවිතයක් ගතකොට, මරණින් පසු වැටෙන්නේ දුගතියට නම්, ඔබ ඔබේ ජීවිතය අරපරිස්සමින් පරිහරණය නොකළ මනුෂ්‍යයන් බවටයි පත්වෙන්නේ.

ස්වාමීන් වහන්ස, දෙමාපියන්ට කීකරු, ගුණධර්ම වඩන, මෙත් සිත ප්‍රගුණ කරන දරුවන්ට දෙවියන් ආශිර්වාද කරනවා ද?

තව්තිසා දිව්‍යතලයේ වැඩසිටින ප්‍රධාන දෙවියා තමයි ශක්‍ර දෙවියන්. මේ ශක්‍ර දෙවියන් මේ ශක්‍ර දෙවි තනතුරට පත් වෙන්න හේතුවෙන ප්‍රධාන කාරණය තමයි පෙර මනුෂ්‍ය ජීවිතයේදී තම දෙමාපියන්ට කීකරු වීම, දෙමාපියන්ට උපස්ථාන කිරීම සහ මෙත් සිත ප්‍රගුණ කිරීම. මෙම නිසා පින්වත් දරුවන් තම දෙමාපියන් කෙරෙහි මෙත් සිත පතුරුවමින් දෙමාපියන් සතුටු කරන කොට, ශක්‍ර දෙවියන් ප්‍රමුඛ සෑම දෙවි කෙනෙකුගේ ම ආශිර්වාදය පින්වත් දරුවන්ට ලැබෙනවා. දෙවිවරු දිව්‍යතලවල සිට දිව්‍ය චක්ඛුවලින් දරුවන්ගේ යහපත් ක්‍රියාවන් දැකලා, දිව්‍ය ශ්‍රෝතවලින් දරුවන්ගේ යහපත් ක්‍රියාවන් අහලා දෙවියන් සතුටු වෙනවා. මේ දරුවා දිව්‍ය දරුවෙක්, මේ දරුවා සත්පුරුෂ දරුවෙක්, මේ දරුවා අප අතරට ම මරණින් පසු පැමිණේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

නමුත් යම් දරුවෙක් දෙමාපියන්ට මෙත් සිත පතුරුවන්නේ නැති නම් දෙමාපියන්ට අකීකරු නම් එවැනි දරුවන්ට ආශිර්වාද කරන්නේ නරක නපුරු අමනුෂ්‍යයින්. පෙර ජීවිතයේදී දෙමාපියන්ට අකීකරු වෙලා, දෙමාපියන්ට කායිකව, මානසිකව පීඩා කරලා, එම අකුසල් නිසා යක්ෂයින්, ප්‍රේතයින්, නපුරු දෙවියන් වෙලා උපත ලබපු අමනුෂ්‍යයින් සිටිනවා. මේ අමනුෂ්‍යයින් කැමති දෙමාපියන්ට අකීකරු දරුවන්ටයි. දෙමාපියන්ට අකීකරු දරුවන්ට මෙවැනි අමනුෂ්‍යයින් ගොඩක් ආශිර්වාද කරනවා, තව තව දෙමාපියන්ට අකීකරු වෙන්න ගුණ ධර්මයන් හීනකර ගන්න කියලා. මොකද එම අමනුෂ්‍යයන් දන්නවා

දෙමාපියන්ට අකීකරු දරුවන් මරණින් පසුව එම අමනුෂ්‍යයන් අතර ම උපත ලබනවාය කියලා. එවිට තමන්ගේ පිරිවර වැඩි වෙනවාය කියලා.

දෙමාපියන්ට අකීකරු දරුවන් නැවත මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයෙක්ව උපත ලැබුවොත් කුඩා කාලයේදී එම දරුවාට දෙමාපියන් අහිමි වෙනවා. එසේත් නැත්නම් දෙමාපියන් එම දරුවාව අතහැර දමනවා. ළමා නිවාසවල ජීවත්වෙන දරුවන් කියන්නේ, පෙර ජීවිතයේ දී දෙමාපියන්ට අකීකරු වූ දරුවන්. එම නිසා ළමා නිවාසවල ජීවත්වෙන, දෙමාපියන් අහිමි පින්වත් දරුවෝ තමන්ට උපස්ථාන කරන වැඩිහිටි මාමලා නැන්දලාව දෙමාපියන් වශයෙන් දකලා කීකරු වෙන්න දක්ෂ වෙන්න ඕනේ. දැන් ඔය බ්‍රොයිලර් කුකුළු පැටවු ඉන්නවානේ, එම කුකුළු පැටවුනට මව් කිකිළියක් නැහැ. බිත්තර රක්කවන යන්ත්‍රයකින් ලැබෙන උණුසුමෙන් තමයි එම කුකුළු පැටව් ලෝකයට බිහිවෙන්නේ. අම්මා කෙනෙකුගේ, තාත්තා කෙනෙකුගේ උණුසුමත් ආදරයත් එම බ්‍රොයිලර් කුකුළු පැටවුන්ට ලැබෙන්නේ නැහැ. පෙර ජීවිතයේ මනුෂ්‍යයන් වශයෙන් ඉපදිලා, දෙමාපියන්ට අකීකරුවීම, උපස්ථානය නොකිරීම නිසා ම, එම බරපතල අකුසල් විපාකය හේතුවෙන් දෙමාපියන්ගේ රැකවරණය එම කුකුළු පැටවුන්ට අහිමි වෙනවා. ඒ වගේමයි, තිරිසන් ලෝකයේ ජීවත් වෙන හුඟක් සතුනට අම්මාගේ ආදරය, රැකවරණය පමණයි ලැබෙන්නේ. තාත්තාගේ ආදරයක් ලැබෙන්නේ නැහැ. සමහර තිරිසන් අම්මලා සිටිනවා තමන් ලෝකයට බිහිකරන පැටවුන්, එම තිරිසන් අම්මලා ම මරාගෙන කනවා. මේ සෑම ක්‍රියාවක් ම අතීතයේ දෙමාපියන්ට අකීකරු වීම, උපස්ථාන නොකිරීම, දෙමාපියන්ට හිංසා කිරීම වැනි අකුසල හේතුවෙන් සකස් වෙන හේතුඵල ධර්මයන් වශයෙන් දකින්න දරුවන් දක්ෂ වෙන්න ඕනේ. සාරා සංඛ කල්ප ලක්ෂ ගණනාවක් පටන් පටිච්චසමුප්පන්නව මැරෙමින්, ඉපදෙමින් පැමිණෙන මේ භව ගමනේදී අපි සැමට ම ධර්මයට වඩා මුණගැසිලා තිබෙන්නේ අධර්මයයි. කල්ප ගාණක දීර්ඝ අබුද්ධෝත්පාද කාලයක් පසුකරලයි අපිට කෙටි බුද්ධෝත්පාද කාලයක් මුණගැසෙන්නේ. එම නිසා යහපත් පුරුදුවලට වඩා අයහපත්, නරක, අකීකරු පුරුදු අපේ ජීවිත තුළ

සැඟ වී තිබෙනවා. පුංචි තැනක් වැරදුණොත්, ලොකු අනතුරක් අපේ ජීවිතයට වෙන්න පුළුවන්. මේ හැම අනතුරකින් ම පින්වත් දරුවන්ව මුදවා දෙන්න ඔබ ප්‍රගුණ කරන මෛත්‍රී සිතට හැකියාව තිබෙනවා. මෙත් සිත පින්වත් දරුවාගේ මෙලොව පරලොව දෙකම ජයග්‍රහණය කොට දෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ගෙවාගෙන පැමිණි භව ගමනේදී අම්මලා, තාත්තලා දරුවන් උදෙසා හෙලූ කඳුළු මහා සාගරයේ ජලයට වැඩිය කියලා.

පින්වත් දරුවන් මහා සාගරය දකින කොට, දෙමාපියන් දරුවන් උදෙසා හෙලූ කඳුළුයි, මහ සාගරය තුළින් ඔබ දැකිය යුත්තේ. දරුවන් උදෙසා අම්මලා තාත්තලා මෙතරම් දුක් කන්දරාවක් විඳ තිබෙනවා නම් ආදරණීය අම්මලා, තාත්තලාව මේ කටුක දුකින් මුදවා ගැනීමේ යුතුකම දරුවන්ට තිබෙනවා. එම ධර්මානුකූල යුතුකම දරුවන්ට ඉටුකල හැක්කේ මුලින් ම දෙමාපියන්ට කීකරු වෙමින්, එම කීකරුභාවයත් අකීකරුභාවයත් අනිත්‍යවන සංස්කාරයක්ය කියන කාරණය ධර්මානුකූලව මතුකොට දැකීමෙන්ය. මේ දැකීමේ ආරම්භය වර්තමානයේ පින්වත් දරුවන් ප්‍රගුණ කරන මෙත් සිතමයි.

ස්වාමීන් වහන්ස, මම ගුරුවරියක්. මගේ සිත තෘප්තිමත් නැහැ. පන්ති කාමරයේ දරුවන්ගේ හොඳ සහ නරක ඉදිරියේ මගේ සිත විසිරෙනවා. මම කුමක්ද කළ යුත්තේ?

යම් පින්වතෙකුගේ සිත විසිරෙනවාය කියන්නේ පංචනීවරණ සකස් වෙනවා. පංචනීවරණ සකස්වෙන්නේ අධර්මානුකූලව සිතන නිසා. ධර්මානුකූලව සිතන තැනයි ප්‍රීතිය, පස්සද්ධිය, උපේක්ෂාව ජීවිතයට අයිති වෙන්නේ. පින්වත් ගුරුතුමිය ඉදිරිපිට වාඩි වී සිටින දරුවන් හතළිස්දෙනා කියන්නේ, අතීත සංස්කාරයන්ගේ ඵලයක්, එකිනෙකට වෙනස් සංස්කාරයන්ගේ ඵලයක්. අතීතයේ එම දරුවන් පුහුණු කළ සංස්කාරයන්ට අදාළවයි, දරුවන්ගේ දැනීම් (විඤ්ඤාණය) සකස් වෙන්නේ. ගුරුතුමිය බලාපොරොත්තු වෙනවා නම් දරුවන් හතළිස් දෙනා ම එක ම ඉරියව්වකින් සිටිය යුතුයි කියලා, එම සිතුවිල්ල අයිති වෙන්නේ මෝහයටයි, අධර්මයටයි දරුවන්ගේ හැසිරීම්,

දක්ෂතාවයන්, වත්පොහොසත්කම් එකිනෙකට වෙනස් වෙන්නේ අතීත සංස්කාරයන්ගේ හේතුඵල ධර්මයන් නිසා මිස, දරුවන්ගේ වැරදි නිසා නොවේ. එම නිසා දරුවන්ගේ හැසිරීම්, දක්ෂතාවයන්, වත්පොහොසත්කම්වලට විශේෂත්වයක් නොදී, පන්ති කාමරයේ දරුවන් හතළිස් දෙනාට ම සම මෙත් සිත පතුරුවන්න ගුරුතුමිය දක්ෂ විය යුතුයි. මනුෂ්‍ය දරුවෙකු වෙලා මේ බුද්ධෝත්පාද කාලයේ ඉපදෙන සෑම දරුවකු පසුපස ම සැඟවුණ ලොකු පිනක් තිබෙනවා. ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින් ම සමත් වෙලා අතිකුත් ප්‍රධාන පාසලකට පැමිණෙන ඈත පිටිසර ගමක දරුවෙක් කියන්නේ ලොකු පුණ්‍ය ශක්තියක් ජීවිතය පසුපස සැඟවී ඇති දරුවෙක්. එම නිසා පින්වත් ගුරුමහත්ම මහත්මීන් සෑම සිසු දරුවෙකුට ම සම මෙත් සිත නොපැතිරවීමෙන් ගුරුතුමන්ලාටත් බලවත් අකුසල් සිදු වෙන්න පුළුවන්. පන්ති කාමරය තුළදී ගුරු සිත අතෘප්තිමත්භාවයට පත්වෙන්න පුළුවන්. පින්වත් ගුරුතුමා ගුරුතුමිය දක්ෂ වෙන්න ඕනේ, ඔබේ පන්ති කාමරයේ අධ්‍යාපනය හදාරන සිසු දරුවන් තුළින් සද්ධර්මය මතුකොට ගන්න. එවිට පින්වත් ඔබගේ ගුරු වෘත්තියත් ධර්මයේ අර්ථයන් වැඩෙන වෘත්තියක් වෙනවා. පින්වත් ඔබේ පන්ති කාමරයේ ඔබෙන් ශිල්ප හදාරන සෑම දරුවෙක් ම සංසාරයේ ඔබට අම්මා තාත්තා වෙලා තිබෙනවා, සංසාරයේ ඔබේ ම දුව පුතා වෙලා තිබෙනවා, සංසාරයේ ඔබේ දෑස පෑදූ ගුරුවරයා ගුරුවරිය වී තිබෙනවා. පින්වත් ගුරුතුමිය ඉදිරියේ සිටින ඔය සෑම දරුවෙක් ම අතීතයේ පටිච්චසමුප්පන්නව, ඔබ කුසේ දරාගෙන සිටි දරුවන්මයි, රුධිරය කිරි කොට පෙවූ දරුවන්මයි. අතීතයේ පටිච්චසමුප්පන්න ඥාතිත්වය ධර්මානුකූලව මතුකොට දකිමින්, පන්ති කාමරයේ දරුවන් තුළින්, ධර්මය දකින්න පින්වත් ගුරුතුමිය දක්ෂ වෙන්න ඕනේ. ධර්මය දකින තැන ප්‍රීතිය, පස්සද්ධිය, උපේක්ෂාව ජීවිතයට එකතු වේවි. ධර්මය නොදකින තැන ජීවිතයට එකතු වෙන්නේ අතෘප්තිමත් විසිරුණු සිතක උරුමය පමණක්මයි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති
සියලු දානයන් අතර ධර්ම දානයම අග්‍රවන්නේය.

පුණ්‍යානුමෝදනාව

- මෙම ධර්ම දානමය කුසල් බෙලෙන් අප සැමට උතුම් දහම් මග පෙන්වා දෙන සිල්වත් වූ, ගුණවත් වූ, උත්තම පුණ්‍ය ක්ෂේත්‍රයක් බඳු වූ, ඉතා දුර්ලභව අප ලද බුද්ධ පුත්‍රයන් වහන්සේ වන අති පූජ්‍ය රාජගිරියේ අරියඥාණ ස්වාමීන් වහන්සේ ඇතුළුව උතුම් සදහම් මඟ අප සැමට විවර කරදෙනු ලබන සියලුම මහා සංඝරත්නයට, නිදුක් නිරෝගී චිර ජීවනය ලැබේවා ! අප සැමට තව තවත් සදහම් මග විවිර කිරීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය සහ නිරෝගි සුවය ලැබේවා !

- මහේෂාක්‍ය, අල්පේෂාක්‍ය, දිව්‍යරාජ සමූහය ද මේ උතුම් ධර්ම දානමය පින අනුමෝදන්ව සම්මා සම්බුද්ධ ශාසනය චිරාත් කාලයක් රැකදේවා!

- මෙම උතුම් ධර්ම දානය ලබන පින්වත් දූ පුතුන් සැම දෙනාටම කුඩා කළ සිටම මෙත් සිත වඩා ගනිමින් දහම් මඟ ප්‍රගුණ කිරීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය, නිදුක් නිරෝගීභාවය, කායික මානසික සුවපත්භාවය ලැබීමටත් ඒ තුළින්ම ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු ශක්තිමත්ව සිදුකර ගැනීමටත් මෙම ධර්ම දානමට කුසලය හේතු වේවා!

මෙම ධර්ම දානය සඳහා දායක වන සියලු දෙනාටම ඝෝර කටුක භයානක සංසාරයේ බිය දැක මේ ආත්ම භවයේදීම සසර දුකින් එතෙර වීම සඳහා විදසුන් නුවණ සකස් වීම සඳහා, මෙම ධර්ම දානමය කුසල කර්මය හේතු වේවා! පාරමිතාවක්ම වේවා !



"දෙමාපියන්ගේ නෙතින් ගලන
සතුටු කඳුලක සැඟවුණ
සුගතියත්,
දෙමාපියන්ගේ නෙතින් ගලන
දුක් කඳුලක සැඟවුණ
දුගතියත්,
තම සතිය සිහියෙන්,
මතුකොට දකින දරුවා
දෙමාපියන්ට
සතුටු කඳුලක්ම දෙන්නේය"

දරුවන් දෙමාපියන්ට දක්වන කීකරුභාවය තුළ
සියළුම මනුෂ්‍ය ධර්මයන්
දේව ධර්මයන්, බ්‍රහ්ම ධර්මයන්
තව තවත් උත්කෘෂ්ඨව වැඩෙනු ඇත
දරුවන් දෙමාපියන්ට දක්වන අකීකරුභාවය තුළ
මේ සියළුම ගුණාත්මක ධර්මයන්,
දෑස් පනාපිටම විනාශ වී යාමද
ධර්මතාවයන්මය....

ISBN 978-955-7887-14-2
මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හැරීම සඳහාය